මිහිරි සරුඵල

இனிமையான வெற்றி

Sweet Success



වාර්ෂික ගිණුම් වාර්තාව -2014

வருடாந்த அறிக்கை -2014

Annual Report -2014

සීමාසහිත ලංකා සීනි සමාගම

லங்கா சீனி நிறுவனம் விமிட்டெட்

Lanka Sugar Company (Private) Limited.





සීමාසහිත ලංකා සීනි සමාගම

වාර්ෂික වාර්තාව 2014

27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකා
දුරකථන: +94 11 523 2583 ෆැක්ස්: +94 11 250 0674
ඊ මේල් : infosugarsrilanka@gmail.com

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

මිහිරි සඵලත්වය

කරා ගමනාරම්භයක්



අන්තර්ගතය

අපගේ චින්තනය, අපගේ ඉදිරි දැක්ම, අපගේ ඉලක්ක, උපාය මාර්ග, පර්යේෂණ සහ සංවර්ධනය, සංස්ථාපනික ප්‍රජා වගකීම්	4
මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුකිරීම්	6
සභාපතිවරයාගේ ප්‍රකාශය	8 -9
අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ ප්‍රකාශය	10
අවදානම් කළමනාකරණය	12
අප සංස්කෘතිය සහ සාරධර්ම	14
විගණනකාරක සභාවේ වාර්තාව	15
අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ පැතිකඩ	17 - 19
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ සංවිධානයේ ව්‍යුහය	21 - 25
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව	26 - 27
සමස්ථ ආදායම් ප්‍රකාශනය	28
මූල්‍ය තත්ව ප්‍රකාශනය	29
ස්කන්දයෙහි වෙනස්වීම් ප්‍රකාශනය	30
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	31
මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්	32 - 52
කණ්ඩ වශයෙන් මූල්‍ය තොරතුරු- සෙවනගල සහ පැල්වත්ත	53 - 60
කණ්ඩ වශයෙන් ප්‍රස්තාරික සැසඳීම - සෙවනගල සහ පැල්වත්ත	61
ප්‍රගති වාර්තාව	62 - 65
පෙරකලාසිය	66
සංස්ථාපනික තොරතුරු	67

අපගේ චින්තනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීමෙන් ජාතික සංවර්ධනයට දායක වීම තුලින් සීනි මත පදනම්වූ ගොවිතැන් සහ කර්මාන්ත හරහා කෘෂිකාර්මිකයන්ගේ ප්‍රජා ආර්ථික තත්වය උසස් කිරීම

අපගේ ඉදිරි දැක්ම

2025 වන විට සීනි සැපයුමින් ස්වයංපෝෂිත වීම

අපගේ ඉලක්ක

333 පරමාර්ථය - කෙටි කාලීන - (2017 තෙක් වසර 3 කට)

1) මෙට්‍රික් ටොන් 80,000ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවිතැනෙහි යෙදෙන පවුල් 15,000ක් නඩත්තු කිරීම.
3) සෘජු රැකියා අවස්ථා 8,000ක් සැපයීම.
4) කෘෂිකාර්මික පවුලක දළ ආදායම මාසිකව රු.30,000 දක්වා වැඩි කිරීම.
5) ජාතික සීනි අවශ්‍යතාවයට 15%ක දායක වීමක් කිරීම.
6) රුපියල් බිලියන 2.2 ක දළ ලාභයක් ලබා ගැනීම.
7) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 20 ක් ඉතිරි කිරීම.
8) සමගාමීව මෙගා වොට් 30 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

666 පරමාර්ථය - දිගු කාලීන - (2020 තෙක් වසර 6 කට)

1) මෙට්‍රික් ටොන් 240,000 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවිතැනෙහි යෙදෙන පවුල් 40,000 ක් නඩත්තු කිරීම.
3) සෘජු රැකියා අවස්ථා 18,000 ක් සැපයීම.
4) කෘෂිකාර්මික පවුලක දළ ආදායම මාසිකව රු.40,000 දක්වා වැඩි කිරීම.
5) රුපියල් බිලියන 7 ක දළ ලාභයක් ලබා ගැනීම.
6) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 16 ක් ඉතිරි කිරීම.
7) සමගාමීව මෙගා වොට් 75 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

උපාය මාර්ග

1) වගාකරුවා මත පදනම්වූ අප වගා ආකෘතිය.
2) වැඩි ඵලදාවක් ලබාදෙන ප්‍රභේදයන්, වඩාත් ගුණාත්මක කෘෂිකාර්මික ව්‍යවහාරය සහ කාර්යක්ෂම උපකාර සේවාවන් හරහා ඵලදායිතාවය වැඩිකිරීම. එමගින් ගොවියන්ට වැඩි ලාභයක් ලබා දීම.
3) ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදායිතාවය සඳහා දිරිගැන්වීම් ලබා දීමෙන් ගොවියන් අභිප්‍රේරණය කිරීම
4) ඵලදායිතා දිරිගැන්වීම් සහ පටිපාට හරහා නිලධාරී මණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකා සීනි පර්යේෂණ ආයතනය සමග උක් වගාව සහ සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

සංස්ථාපනික ප්‍රජා වගකීම්

උක් වගාවේ යෙදෙන ගොවියන්ගේ ආදායම් අගයන් වැඩිකර, අපේ මෙහෙයුම් දියත් කරන පරිසරය සහ ප්‍රජාව තුලට අගයන් එකතු කල යුතු බව අපේ විශ්වාසයයි.



මිහිරි සවුලත්වය

සඳහා සාරවත් බවින් පොහොසත් වීම



සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුකිරීම් - 2014

(අගයන් රුපියල් මිලියන වලින් දැක්වේ)	2014	2013
මූල්‍යමය ඉස්මතු කිරීම්		
පිරිවැටුම් අගය	5,539.31	5,747.05
විකුණුම් පිරිවැය	(4,904.06)	(3,833.75)
දළ ලාභය	635.25	1,913.30
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය	(211.01)	1,345.72

මෙහෙයුම් කාර්යසාධනය	2014	2013
ඉඩම් වගාව		
ඉඩම්වගාවට සුදුසු (හෙක්ටෙයාර්)	17,499	17,499
වගාකල (හෙක්ටෙයාර්) 31/12	11,280	10,314
වගා බිම් %	64%	71%

අස්වනු ව්‍යාපෘතිය	2014	2013
ලබාගත් අස්වැන්න (මෙට්‍රික් ටොන්)	409,582	510,104
2013 වැඩිවීම් ප්‍රතිශතය	-20%	35%
සීනි ලබාගැනීමේ ප්‍රතිශතය	7.90%	8.34%

සීනි නිෂ්පාදනය	2014	2013
මෙට්‍රික් ටොන්	32,364	42,549
එක පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	6.17	7.57

මානව සම්පත්	2014	2013
ස්ථිර	1,557	1,630
ගිවිසුම	492	736
අනියම්	2,645	2,530
වාරික	510	685
පුහුණුලාභීන්	40	41
මුළු ගණන	5,244	5,622

මිහිරි සඵලත්වය

අහස සමග ගැටෙන විටක



සභාපතිවරයාගේ ප්‍රකාශය



2014 දෙසැම්බර් 31 වන දින අවසන්වූ වසර සඳහා සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීම පිළිබඳව මම සතුටු වෙමි.

සමාලෝචනයට ලක්වන වසර තුලදී බොහෝ සාර්ව සහ ක්ෂුද්‍ර ආර්ථික කරුණු වල බලපෑම සමාගමේ ක්‍රියාකාරිත්වයට අභියෝගයක් විය. වසරේ පළමු කාර්තු 03 තුලදී ඇති වූ දරුණු නියගය උක් නිෂ්පාදනයට සහ සීනි ලබාගැනීමට දරුණු ලෙස බලපෑම් කරන ලදි. හෙක්ටයාරයකට සීනි අස්වැන්න මෙට්‍රික් ටොන් 53.82 සිට 39.38 දක්වා පහත වැටුණු අතර සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 8.40% සිට 7.90% දක්වා පහත වැටීමෙන් නිෂ්පාදන පරිමාවට විශාල බලපෑමක් සිදුවිය. අපගේ සෙවනගල ඒකකයේ වගාවේ කොටසක් ලෙස එකී බලපෑමට ලක් නොවුයේ එය වාරි ඉඩම්වල වූ බැවිනි.

ආර්ථික වාතාවරණය

ලෝකයේ ආර්ථිකය අසතුටුදායක වූවද ශ්‍රී ලංකාවට GDP වර්ධනය 7.8% ක ප්‍රමාණයක් ලබා ගැනීමට මෙම වසරේ හැකිවුනු අතර 2013 එකී වර්ධනය 6.5% ක පැවතුණි. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුවට පොළි අනුපාතය අඩු කිරීමට හැකි වුනු අතර උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගත හැකිවිය. ආර්ථිකයේ වර්ධනයට විශාල දායකත්වයක් වූයේ කාර්මික, කෘෂිකර්මික සහ සේවා අංශයන්ය.

කර්මාන්තය දෙස නැවත බැලීම

ස්වභාවධර්මය කර්මාන්තයට අහිතකරව බලපෑවද වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් 32.364 ක් අපට නිෂ්පාදනය කිරීමට හැකිවුනු අතරම එය මෙරට සීනි අවශ්‍යතාවයෙන් 5% කි. එමෙන්ම එය දේශීය සීනි නිෂ්පාදනයෙන් 62% ක් විය.

මෙම වසරතුල ලෝකයේ සීනි මිල විශාල වශයෙන් පහත වැටුනු අතර පෙර වර්ෂ හා සැසඳීමේදී ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස තුළදී සීනි ආනයනය අධික ලෙස ඉහල ගිය අතර ආනයනකරුවන් විසින් ඔවුන්ගේ අතිරික්ත තොග ලබා ගත්තේය. මෙය වෙළඳ පොළේ විකුණුම් මිල ගණන් පහත වැටීමට හේතු වුනු අතර අප විසින් දෙන ලද සීනි මිල ගණන් අනුව ප්‍රධාන තොග වෙළඳුන් මිලට ගැනීමට මැලිවිය. පසු කාලයේ දී රජය විසින් සීනි බද්ද වැඩි කළද එහි බලපෑම සම්පූර්ණයෙන් ආපසු හැරවීමට නොහැකි විය. වසර අවසානයේ දී සීනි වල තොග මිල ගණන් කිලෝ එකකට රුපියල් අසු පහකට (රු.85.00) වඩා අඩුවිය.

සමාගමේ ක්‍රියාකාරිත්වය

මූල්‍ය වර්ෂය දෙස නැවත බැලීමේදී බදු ගෙවීමට පෙර සමාගම රුපියල් මිලියන 211 ක මෙහෙයුම් පාඩුවක් පෙන්වීය. එය 2013 වර්ෂයට සාපේක්ෂව 116% ක පහත වැටීමකි. නිෂ්පාදන ධාරිතාව පහත වැටීමට ඍජුවම හේතු වූයේ කාලගුණයේ අයහපත් තත්වය වූ අතර අඩු මිලට සීනි අධික ලෙස ආනයනය කිරීමෙන් සීනි වල විකුණුම් මිල අඩුවී ලාභය පහත වැටීමට බලපෑවේය. සේවකයින්ගේ වැටුප වැඩි කිරීම, රුපියල් මිලියන හැත්තෑපහක් (රු මිලියන .75) ගොවීන්ට නියං ආධාර සැපයීම සහ රු. මිලියන 4.17 බදුල්ල දිස්ත්‍රික්කයේ සීනි වගාව වැඩි දියුණු කිරීම යන මේවාට ගෙවන ලද මුදල් හේතු කොට ගෙන සමාගමේ කෙටි කාලීන ලාභයට අහිතකර ලෙස බලපාන ලද අතර එය අනාගතය උදෙසා කළමනාකාරිත්වය විසින් ගනුලැබූ කාලෝචිත තීරණයක් වශයෙන් සිතිය හැක. අනාගතයේදී එහි ප්‍රතිලාභ ලැබෙන බව රහසක් නොවේ.

ප්‍රාග්ධන වියදම්

අපගේ පැල්වත්ත එකකයේ කර්මාන්තශාලා උපකරණ සහ යන්ත්‍රෝපකරණ සඳහා රුපියල් මිලියන 80.04 ආයෝජනය කරන ලද අතර රුපියල් මිලියන 26.07 ක්ෂේත්‍ර පිරියත සහ යන්ත්‍රෝපකරණ සහ රුපියල් මිලියන හතක් ගොඩනැගිලි සඳහා ආයෝජනය කරන ලදි. එමෙන්ම සෙවනගල ඒකකය විසින් රුපියල් මිලියන 69.6 ක් මෝටර් වාහන සඳහාද රුපියල් මිලියන 7 ක් කර්මාන්තශාලා උපකරණ සඳහාද ආයෝජනය කරන ලදී.

සුභ සාධනය

වර්ෂය තුළදී සමාගම විසින් සැලකිය යුතු මුදලක් සුභ සාධනය සඳහා යොදවනු ලැබීය. සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් හා දිවාසුරකුම් මධ්‍යස්ථාන සඳහා වෙනම නඩත්තු කාර්ය මණ්ඩලයක් හා යටිතල පහසුකම් වෙන් කර ඇත. සමාගමේ සේවය කරන පවුල් වල කුඩා ළමුන් සඳහා සමාගම විසින් පාසැල් ගමනාගමන පහසුව සපයනු ලැබේ. නියං කාලයේදී රුපියල් මිලියන හැත්තෑපහක (75) ක මුදලක් නියං සහනාධාර ලෙස ගොවීන්ට ගෙවන ලදි.

සම්භාවනාව

ගම්බද ගොවීන්ගේ දියුණුව, ජීවන තත්වය නගා සිටුවීම සහ ජාතික ආර්ථිකය ප්‍රවර්ධනය සඳහා දායකවීම හේතුවෙන් සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම - සෙවනගල ඒකකයට 2014 ජාතික කෘෂි ව්‍යාපාර රත්න සම්මානය ජාතික කෘෂි ව්‍යාපාර කවුන්සිලය විසින් පිරිනමන ලදි.

ඉදිරි දැක්ම

ඉදිරියේ දී ශ්‍රී ලංකාව සීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කරන අතර එහි සංවර්ධන ඉලක්කයන් සපුරාගත හැකියැයි අපේක්ෂා කෙරේ. රජයේ ප්‍රතිපත්තීන් සහ පොළී අනුපාතය අඩුවීම හේතුවෙන් අපට වෙනත් නව ආයෝජන සඳහා යොමුවීමට සිදුවේ. අපගේ නිෂ්පාදන සඳහා නිශ්චිත වෙළඳ පොළක් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තිරතුරුවම උක් වගාව වැඩි කිරීමට යොමුවේ. දැනට ගොවීන්ව පොළඹවනවා සේම යහපත් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා නව ගොවීන් කර්මාන්තයට ගෙනඒමට අවශ්‍ය වේ. නව ඉඩම් අත්පත් කර ගැනීම සහ අපගේ වගාවේ ඵලදායිතාව වැඩි කිරීමද වැදගත්ය. ප්‍රධාන නිෂ්පාදනයට අමතරව මෙහෙයුම් වල උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අතුරුනිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට අප යොමු වී ඇත. සෙවනගල සහ පැලවත්ත පිළිවෙලින් පැයකට 10 MW සහ 15 MW විදුලිය නිපදවීමේ ව්‍යාපෘති අප විසින් ඇගයීම් කර ඇත.

අගය කිරීම

මම පසුගිය අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමණාකාරිත්වයට සහ සේවක මණ්ඩලයට 2014 වර්ෂයේදී සහ ඊට පෙර සිදුකල සියලු ප්‍රයත්නයන්ට සහ අගනා දායකත්වයට මාගේ අවංක ස්තුතිය පුද කරමි.

මම උක්වගාකරුවන්ටද, අප බෙදා හැරීමේ ජාලයට අනුයුක්ත ගණුදෙනුකරුවන්ටද, සීනි තොග වෙළෙන්දන්ටද, බැංකු සහ අනෙකුත් රජයේ ආයතනයන්ටද නොකඩවා සමාගම සමග සිටි සැමට මගේ ස්තුතිය පල කරමි.

අවසාන වශයෙන් සමාගම ජයග්‍රහණය සඳහා රැගෙන යෑම සඳහා මඟ පෙන්වන්නාවූ නව අධ්‍යක්ෂ මණ්ඩලයට සඳහා මාගේ ස්තුතිය පිරිනමමි.

නවීන් අධිකාරම
සභාපති
2015 දෙසැම්බර් 01
කොළඹ

අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ ප්‍රකාශය



සියලුම හිතවතුන් වෙතය,

පරිසරය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමට 2014 මුදල් වර්ෂය අපහසු එකක් වූයේ ආනයනය කරන සීනි වලට අයකරන ලද බදු එම කාලය තුළදී පහත වැටුනු බැවිනි. මෙම හේතුවෙන් සීනි තොග වෙළඳුන් විසින් දේශීය සීනි ඉල්ලුම අඩු කරමින් ස්වාරක්ෂක තොග පවත්වා ගෙන යන ලදි. එබැවින් එකී මිල ගණන් සඳහා තරඟ කිරීමට ලංකා සීනි මිල පහත දැමීමට සිදුවිය. සීනි මෙට්‍රික් ටොන් එකක අයවැය විකුණුම් මිල රුපියල් 93,250 වූ අතර සාමාන්‍ය මෙට්‍රික් ටොන් එකක විකුණුම් මිල වර්ෂය තුළදී රුපියල් 89,441 විය. එබැවින් අයවැයට සාපේක්ෂකව සමාගමට රුපියල් මිලියන 122 ක පාඩුවක් දැරීමට සිදුවිය. අවුරුද්ද ආරම්භයේදී බරපතල නියගයක් ඇති වූ බැවින් මෙහෙයුම් ක්‍රියාවලිය ද බරපතළ අසීරු තත්වයකට පත්විය. මෙහි ප්‍රතිඵලය ලෙස 2013 වසරට සාපේක්ෂව උක්ගස් සැපයීම 19% කින් පහත වැටිනි.

උපාය මාර්ග සහ ක්‍රියාකාරකම්

හෙක්ටයාරයකට අස්වැන්න වැඩිකිරීම සඳහා බිදිති වාරිප්‍රදේශ වැඩිකිරීමට සිදුවූ අතර සමාගම විසින් ගල් අමුණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන තිහක් 2015 පැල්වත්ත අයවැයෙන් වෙන් කරන ලද අතර 2015 ජූනි මස එකී ව්‍යාපෘතිය ආරම්භ කෙරේ. මෙයට අමතරව තවත් රුපියල් මිලියන 12 ක් සස්‍ය විද්‍යා අංශය සඳහා වෙන් කරන ලද අතර උක් සැපයීම වැඩිකිරීම සඳහා රුපියල් මිලියන 15 ක් කේන්ද්‍රීය වතු වාරි උපකරණ සඳහා වෙන් කරන ලදි. අප විසින් බාහිර ගොවි අංශය උනන්දු කරවන අතර වසර තුළදී උක් වල මෙට්‍රික් ටොන් එකක මිල දෙදහස් පහළොවේ (2015) දී රුපියල් පන්සීයකින් වැඩි කරන ලදි. එමගින් අප බලාපොරොත්තු වන්නේ උක් වගා කිරීමේ ගොවීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමටය.

අතුරු නිෂ්පාදන

සීනි කර්මාන්තයේ එහි මොලැසස් නිසියාකාරව කළමනාකරණය නොකළ හොත් එහි නිෂ්පාදන පිරිවැය අඩු කළ නොහැක. මොලැසස් වලින් ප්‍රධාන නිෂ්පාදිතය වන්නේ ENA (Extra neutralized Alcohol) ය. දේශීය මත්පැන් නිෂ්පාදකයින්ට ENA සැපයීමෙන් රටට මත්පැන් ආනයනය කිරීම සඳහා වැය වන විදේශ විනිමය ඉතිරිකර ගත හැක. වර්ෂය තුළදී 3.57% කින් අපගේ ENA නිෂ්පාදනය පහත වැටීමක් සිදුවිය. ENA නිෂ්පාදන මට්ටම ද උක් නිෂ්පාදනය සහ සීනි නිෂ්පාදනයේ ඍජු සබඳතාවයක් ඇත. එම නිසා උක් සැපයීම පහත වැටීම ENA නිෂ්පාදන පහත වැටීමට හේතුවිය. ලංකා සීනි සමාගම ඉදිරි පියවරක් තබමින් ඉන්ඩස්ට්‍රියල් ගෑස් සමාගම සමග කාබන්ඩයොක්සයිඩ් නිපදවීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදි. ඉන්ඩ්‍රස්ට්‍රියල් ගෑස් සමාගම විසින් ලබාගන්නා සෑම කාබන්ඩයොක්සයිඩ් කිලෝවකට රු. 25 ක් ගෙවිය යුතුය. මෙම ව්‍යාපෘතියෙන් වාර්ෂිකව අවම වශයෙන් රුපියල් මිලියන 15 ක දළ ආදායමක් ලබාගැනීමට අප බලාපොරොත්තු වෙමු.

මානව සම්පත්

උසස් තලයේ සේවකයින් තබා ගැනීම අපට අභියෝගයකි. 2014 වර්ෂයේදී සේවක පිරිවැටුම 9% කින් වැඩිවිය. වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් සේවකයින් රඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රඳවා ගැනීමේ දීමනාවක් හඳුන්වාදෙන ලදි.

ව්‍යවසාය සම්පත් සැළසුම් කිරීම (ERP)

තොරතුරු තාක්ෂනයේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සමාගම විසින් නව ERP පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදි. අපගේ අනාවැකිය අනුව ව්‍යාපෘතියේ මුලු වියදම ආසන්න වශයෙන් රුපියල් මිලියන 150 පමණ වේ. ක්‍රියාකිරීමේ අවශ්‍ය පිළිවෙතද, විකුණුම්කරුගේ ඇගයීම් සහ තෝරාගැනීම්, මෘදුකාංග තත්ව සහතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කළමණාකාරිත්වය සහ පෙර ක්‍රියාත්මක කිරීම් නැවත බැලීම සඳහා KPMG ආයතනයට පවරන ලද අතර 2016 අවුරුද්දේ ව්‍යාපෘති ආරම්භ කිරීමට ව්‍යාපෘති පුරෝකතනයක් ඉදිරිපත් කර ඇත.

ඉදිරි දැක්ම

සමාගම විසින් නව තිරසාර ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත. සෙවනගල සහ පැල්වත්තේ 12MW සහ 15MW විදුලි ධාරිතාවක් ඉපයීමට සමාගම විසින් බලශක්ති ව්‍යාපෘතියක් සැළසුම් කර ඇත. මෙම ව්‍යාපෘති සමග සමාගමට එහි විදුලි බිල්පත් ශූන්‍ය කල හැකි අතර අතිරික්තය ජාතික පද්ධතියට විකිණීමෙන් අමතර ආදායමක් ලබාගත හැක.

ප්‍රශංසාව

අපගේ ජයග්‍රහණය වන්නේ අප කණ්ඩායමේ කැපවීමේ ප්‍රතිඵලයකි. පෙර පැවති අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්, ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, සාමාන්‍යාධිකාරීන් සහ අනිකුත් ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් සහ අනිකුත් සියලුම සී/ස සීනි ලංකා සමාගමේ සේවකයින්, අපගේ උක් ගොවීන් අනිකුත් ද්‍රව්‍ය සහ සේවාවන් සපයනු ලබන්නන්, ග්‍රාහකයින් සහ බැංකුකරුවන් විසින් දෙන ලද දායකත්වය අපි අගය කරමු. 2014 වසර සී/ස ලංකා සීනි සමාගමට ඵලදායි වසරක් නොවීය. ඔවුන්ගේ දායකත්වය සහ උත්සාහය, උපකාරය හේතුකොට ගෙන සමාගමට ඒවා උසුලා ගැනීමට හැකිවිය. අපගේ ඉලක්ක සහ පරමාර්ථ ජයග්‍රහණය කිරීම සඳහා ඔබ සැමගේ උපකාරය හා කැපවීම අත්‍යාවශ්‍යය.

එම්.එච්.ඒ. සන්තාර්
2015 දෙසැම්බර් 01



ජාතික කෘෂි සම්මාන ප්‍රදානය
2014
දීප ව්‍යාප්ත ප්‍රෞඩ රන් සම්මානයෙන් පිදුම්ලත්
(මහා පරිමාණ නිෂ්පාදන අංශය)
සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවනගල



අවදානම් කළමනාකරණය

අවදානම් වර්ගීකරණය	විස්තර කිරීම	ක්‍රියාන්විතයේ සැලසුම
මෙහෙයුම්වලට අදාල අවදානම්.	උක් වගාව සඳහා ඉඩම් වෙන්කිරීම.	◆ උක් මිල රු.4200/- සිට රු.4500/- දක්වා වැඩිකිරීම. ◆ අස්වැන්න සඳහා අත්තිකාරම් සහ අනෙකුත් ද්‍රව්‍ය, ණය පදනම මත පිරිනැමීම. ◆ රජය විසින් පොහොර සහනාධාරය හඳුන්වාදීමෙන් උක් ගොවියන්ට ප්‍රයෝජනයක් අත් විය.
ණයදීමට අදාල අවදානම්.	ගොවියන්ට ආයෝජනය සඳහා දෙන මුදල් බොල්ණය බවට පත්වීම.	ණය ආපසු ලබා ගැනීමට අදාලව කාර්ය මණ්ඩලය වෙත වැඩි වගකීමක් පැවරීම.
උද්ධමනයට අදාල අවදානම්.	ආයෝජන සහ පොදු කාර්යය පිරිවැය වැඩිවීමෙන් ලාභය වෙත වන බලපෑම්.	අඩු නිෂ්පාදන වියදමක් සහ වැඩි ඵලදායිතාව කෙරෙහි අවධාරණය යොමු කිරීම.
වෙළඳපොලේ අවදානම්.	දේශීය සීනි ආනයන කරුවන් විසින් අඩු මිලට සීනි ආනයනය කිරීම.	ඒකකයක පොදු කාර්යය පිරිවැය අඩු කිරීම පිණිස නිෂ්පාදනය වැඩි කිරීම.
පාරිසරික අවදානම්	උක් අස්වැන්නට අලි ඇතුන්ගෙන් හෝ දේශගුණික වෙනස්වීම් බලපාන නිසා ඵලදායිතාව අඩුවිය හැක.	සමාගමේ වියදමින් අලි ඇතුන්ගෙන් හා මිනිස් ක්‍රියාකාරකම් වලින් වන හානිය වැළැක්වීමට අගල් කැපීම, විදුලි වැට බැඳීම වැනි ක්‍රියාමාර්ග ගැනීම


ප්‍රබෝධමත් සිනාව,
මිහිරි සවිලත්වය

අප සංස්කෘතිය සහ සාරධර්ම

අපේ ගොවියන්

ගොවියා අපේ රජුවේ. ලංකා සීනි සමාගමේ විශ්වාසය අනුව ගොවියා අප සමාගමේ ඉතාමත් ප්‍රබල වැදගත් කොටස්කරුවෙකි. සෙවනගල උක් වගා ඉඩම් සීමිත ප්‍රමාණයක් පමණක් තිබීම නිසාවෙන් මෙය සෙවනගලට තීරණාත්මක සාධකයක් වෙයි. මේ සැම ඉඩමක්ම පාහේ වගා කරන්නේ ගොවියන් විසිනි.

හෙක්ටෙයාරයක උක් වගාවෙන් මාසයක ලබාගත හැකි සාමාන්‍ය ආදායම රුපියල් 35,000ක් පමණ වන බව තක්සේරු කර තිබුනි. බොහෝ පලාත්වල උක් වගාවේ යෙදෙන ගොවියන්ගේ ආදායම පහල මට්ටමක පැවතුනි. එය, ගොවියන් එම කර්මාන්තයේ රඳවාගන්නට දිරිමත් කල තත්වයක් නොවීය. ආරම්භයේ පටන් ලංකා සීනි සමාගම මෙම තත්වය හඳුනාගත් අතර සමාගම ගොවියන්ට ඔවුගේ ආදායම වැඩිකරගන්නට බොහෝ කටයුතු කලේය. වර්තමානයේදී ගොවියෙකුට උක් මෙට්‍රික් ටොන් එකකට රුපියල් 4,500/- ක් වන අතර එය මීට පෙර මෙට්‍රික් ටොන් එකක් රු.4,200/- ක් විය. ඒ අනුව සීනි කර්මාන්ත ඉතිහාසයේ ලබා දුන් ඉහලම මිල ලංකා සීනි සමාගම විසින් සතිටුහන් කරන ලදි. තවද පාලනාධිකාරිය විසින් ලාභයෙන් 10% ක් ගොවීයාගේ දිරිගැන්වීම සඳහා වෙන් කරන ලදි.

අපේ ගණුදෙනුකරුවන්

අපේ ගණුදෙනුකරුවන් අපේ බලාපොරොත්තුවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට අධික ප්‍රමාණයක් අපගේ ගණුදෙනුකරුවන් වේ. අපේ මූලික අරමුණ වනුයේ මොවුනට ගුණාත්මක තත්වයෙන් උසස් ස්වභාවික සීනි සාධාරණ මිලකට සැපයීමයි. ශ්‍රී ලාංකිකයෙකුගේ සාමාන්‍ය වාර්ෂික ඒකපුද්ගල සීනි පරිභෝජනය කිලෝග්‍රෑම් 30-35 දක්වා වේ. අප නිෂ්පාදනය දේශීය පරිභෝජනයෙන් 6%ක් පමණක් වන අතර ඉතිරිය ආනයනය කිරීමට සිදුවේ. වාර්ෂිකව සීනි ආනයනය සඳහා ඩොලර් මිලියන 500ක් පමණ වියදම් වෙයි. මෙය අප ජාතික ආර්ථිකයට බරපතල සෘනාත්මක බලපෑමකි.

අප සේවකයින්

අපගේ සේවකයින් අපේ ධනයයි. පක්ෂපාති අභිප්‍රේරිත සේවක පිරිසකින් තොරව කිසිම සංවිධානයකට සාර්ථක වීමේ හැකියාවක් නොමැත. ලංකා සීනි සමාගමේ වැදගත් සාධකයක් වනුයේ එහි මානව සම්පතයි. ඉතිහාසයේ සීනි කර්මාන්තයේ යෙදී සිටි සේවකයින්ට ඔවුන්ගේ ජීවන රටාව තුල සේවා කොන්දේසි වලට අදාලව නොයෙකුත් ගැටලු වලට මුහුණ පාන්නට සිදුවිය. පහල මට්ටමක මාසික වැටුප, ප්‍රසාද දීමනා, උසස් කිරීම් යනාදි නොයෙකුත් ගැටළු මෙයට ඇතුලත් විය. මේ සම්බන්ධව දැනුවත්වූ සමාගම මෙම ගැටළු නිරාකරණය කිරීමට මුල්තැනක්දී කටයුතු කරන ලදී.

යහ පාලනය

අපේ ව්‍යවස්ථාපිත විගණකරුවන් වන්නේ අර්නස්ට් සහ යං (වරලත් ගණකාධිකාරිවරු) වෙයි.

බාහිර විගණකරුවන්ට අමතරව පැල්වත්ත සහ සෙවනගල යන ඒකක දෙකෙහිම සෘජුව ප්‍රධාන විධායක නිලධාරිතුමාට වාර්ථා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු ඇත. මෙයට අමතරව අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරිතුමා/සභාපතිවරයා වෙත වාර්ථා කරන අතර විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයන් තුන්දෙනෙකුගෙන් සමන්විත වන අතර අභ්‍යන්තර විගණන වාර්තා සමස්ථයක් ලෙස නැවත පරීක්ෂා කර බලා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් දැනුවත් කිරීම් ලබා ගන්නා අතර වාර්තා සහ එමඟින් සොයා ගන්නා ලද තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

සංරෝධන

නිරන්තරයෙන් අනාගතය කරා දිශානත වීම සඳහා වැදගත් ගැටළු කිහිපයක් තවමත් විසඳිය යුතුව ඇත.

සමාගමට අයත් නොවන චංචල දේපල හේතුකොටගෙන පැල්වත්ත සහ සෙවනගල යන ස්ථාන දෙකෙහිම අවහිරතාවයන් පවතින අතර නීතිමය ක්‍රියාදාමයන් අවසන් වීමෙන් පසු ඒවා ක්‍රියාවලියෙන් ඉවත් කිරීම හෝ ක්‍රියාවලියට අන්තර්ගත කල හැකිය.

සෑහීමකට පත්විය හැකි ඉඩම් ප්‍රමාණයක් අත්පත්කර ගැනීම ඉතා සෙමින් සිදු වන අතර කළමනාකරණයට පාලනය කරගත නොහැකි තත්වයක පවති. මෙම අවශ්‍යතාවය ඉටුවන තුරු අපේ මධ්‍යම කාලීන සහ දිගුකාලීන සැලසුම් අත්හිටුවීමට සිදුවී ඇත.

ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාලීම සඳහා උපාය මාර්ග දැනටත් කළමනාකරණය විසින් සම්පාදන කර ඇති අතර අප ව්‍යාපෘතියට හරස්වන තවත් ගැටළුවක් වනුයේ නව අයෝජනයට අරමුදල් සපයා ගැනීමය. බොහෝ බැංකු විසින් සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ඇපයක් වශයෙන් බලාපොරොත්තු වේ. නමුත් පැල්වත්ත සහ සෙවනගල ඉඩම් සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමට අයත් නොවේ.

පැල්වත්තේ තොරතුරු තාක්ෂණ (IT System) පද්ධතිය තුල මෙහෙයුම්වල ඉතිහාසයත් වර්තමානයත් අඩංගු තොරතුරු තැන්පත්ව ඇත. නමුත් සෙවනගල සේවක තොරතුරු සියල්ලක්ම පෙර අයිතිකරුවන් විසින් රැගෙන ගොස් ඇති හෙයින් සේවකයන්ගේ පාරිතෝෂික දීමනා, ගෙවීම්, සම්පාදන හෝ වෙනත් සේවකයින්ට සම්බන්ධ තොරතුරු අප සතුව නැත. එමනිසා සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ පෙර කළමනාකරණය විසින් පවත්වාගෙන ගිය සටහන් පොත් යනාදිය නැවත ලබාගැනීමට රජය පියවර ගතයුතුව ඇත.

විගණන කාරක සභාවේ වාර්තාව

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

සංස්ථාපිත පාලනයේ මඟ පෙන්වීම් යටතේ විගණක කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් 03 ගෙන් සමන්විතය . කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ ලබා දී ඇති බලතල අනුව මූල්‍ය වාර්තා, නීතිමය නිර්නායක අනුගමනය කිරීම, අභ්‍යන්තර පාලනය, අවධානම් කළමනාකාරිත්වය සහ ස්වාධීනත්වය තක්සේරු කිරීම හා බාහිර විගණකාධිපතිවරුන් විසින් සිදුකරන නිර්දේශ ක්‍රියාත්මක කෙරේ. විගණක කමිටුව විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වන අතර එය මහ භාණ්ඩාගාර සාමාජිකයා විසින් මුලසුන දරනු ලැබේ. 2014 විගණක කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයින්ගෙන් සමන්විතය.

ටී.වී. වීරසේන මහතා -සභාපති
තිසත් විජයගුණවර්ධන මහතා
අවන්ත අමරවීර මහතා

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ කාර්යභාරය වන්නේ සමාගමේ දුබලතා සහ අඩුපාඩු වාර්ථා කර සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමය. නීතිමය සහ නියාමක කරුණුවලට අනුකූලව අභ්‍යන්තර මෙහෙයුම් පද්ධති සමාලෝචනය කිරීම, කාර්ය සාධනය විග්‍රහ කිරීම මෙයට ඇතුලත් වේ.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සඳහා අභ්‍යන්තර විගණන අංශ පැල්වත්ත හා සෙවනගල ඒකක වල ස්ථාපිත කර ඇති අතර අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු යටතේ ක්‍රියා කරන අතර සමාන්‍යාධිකාරී (අ.වි) මගින් සමාගමේ සභාපති වෙත සෘජුවම වාර්තා කරයි. මෙම අභ්‍යන්තර විගණන අංශයට අමතරව මාගමගේ සහ සමාගමට (වරලත් ගණකාධිකාරිවරු) විශේෂ පැවරුමක් ලෙස අභ්‍යන්තර පද්ධතිය පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය යෝජනා / නිර්දේශ ලබා ගැනීමට පත් කරන ලදී.

බාහිර විගණනය

බාහිර විගණකරුවන් විසින් ඉදිරිපත් කරන ලද කළමනාකරණ ලිපියට කළමනාකර ප්‍රතිචාර කමිටුව විසින් නැවත විමසන ලදි. කළමනාකාරිත්වය විසින් නිර්දේශ ක්‍රියාත්මක කරන අතර මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණන කමිටුව විසින් කරුණු නිරීක්ෂනය කරන අතර පත්වීම්, නැවත පත්කිරීම් සහ බාහිර විගණකවරුන් ඉවත් කිරීමට සහ පාලනය කිරීමේ කොන්දේසි සහ වැටුප් අනුමත කිරීම සඳහා කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

වසර ඇතුළත කමිටුව විසින් රැස්වීම් 02 ක් පවත්වන ලදි. මූල්‍ය සාමාන්‍යාධිකාරී , ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී (අ.වි) සහ පැල්වත්ත සහ සෙවනගල ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් රැස්වීමකට ආරාධිතයන් වශයෙන් සහභාගි විය. කමිටුව මගින් අභ්‍යන්තර විගණකකරුවන් විසින් වසර පහක් (05) තුළදි ඉදිරිපත් කරන ලද වාර්තා පහක් නැවත විමසා බලන ලදි. මාගමගේ සහ සමාගමේ කාර්තු වාර්තාවන්ද ඇතුළත්ව විගණකකරුවන් විසින් මාසිකව වාර්තා ඉදිරිපත් කරන ලද අතර, එකී විගණක සිදුකරන්නේ උපලේඛනයකට අනුව සහ මීට අමතරව විශේෂ අභ්‍යන්තර විගණක කණ්ඩායම විසින් (මාගමගේ සහ සමාගම) විශේෂිත විගණන පැවරීම් සිදුකරනු ලැබේ. එම රැස්වීම් තුළදී අභ්‍යන්තර පාලනයේ අවශ්‍ය ප්‍රාමාණ නැවත විමසා බලනු ලබන අතර සමාගම විසින් සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිබඳ සත්‍යතාවය කමිටුව විසින් නැවත විමසා බලන ලදි. තවද එය ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතින්ට, 2007 අංක 7 දරණ සමාගම් පනත හා වෙනත් ව්‍යවස්ථාපිත ප්‍රාමාණ වලට අනුකූලව සිදුකරනවා දැයි නැවත විමසා බලන ලදී. එ සඳහා තවදුරත් ප්‍රධාන විධායක නිලධාරී, සමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ සමාගමේ ලේකම් වරුන් විසින් අවශ්‍ය අනුගමනය කිරීම් සඳහා වන සහතික ප්‍රකාශයක් සපයන ලදී.

EY වරලත් ගණකාධිකාරී, සමාගම නැවතවරක් විගණකාධිකාරීන් ලෙස පත්කිරීමට විගණක කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කර කොටස්කරුවන්ගේ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරන ලදි.

ටී.වී. විරසේන
සභාපති
විගණන කමිටුව

මිහිරි සවලත්වය

කරා පැහැදිලි මගක්



අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති
නවින් අධිකාරම මහතා



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී
එම්. එච්. එ. සත්තාර් මහතා



අධ්‍යක්ෂ
තිසත් විජයගුණවර්ධන මහතා - නීතිඥ



අධ්‍යක්ෂ
ආර්. එම්. ගාමිණී රත්නායක මහතා



අධ්‍යක්ෂ
වින්සන්ට් ඩයස් මහතා



අධ්‍යක්ෂ
ඒ. වී. විරසේන මහතා



අධ්‍යක්ෂ
ආචාර්ය නිහාල් සමරප්පුලි

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ තොරතුරු

අපේ සභාපතිවරයා

නවින් අධිකාරම් මහතා - Central Missouri State University, Kansas City, Missouri, USA Bachelor of Science

සභාපති නවීන් අධිකාරම මහතා සංස්ථාපනික පාලනය, ව්‍යාපාර ප්‍රතිව්‍යුහකරණය හා ඇක්‍රිය රාජ්‍ය ආයතන පුනුරුදය කිරීමේ හැකියාවක් ඇති පළපුරුදු උපායශීලි නායකයකු මෙන්ම ඉදිරි දැක්මක් ඇති සාර්ථක ව්‍යාපාරිකයෙකි. ඔහු තොරතුරු හා විදුලි සංදේශ තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් ඇති කළමනාකාරී විධායකයෙකු මෙන්ම බහු ජාතික, බහු සංස්කෘතික හා බහු වාර්ගික වාතාවරණයක් තුළ ශ්‍රී ලංකාව, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පුරුව, චීනය හා නේපාලය වැනි රටවල හා ලෝකයේ ප්‍රධාන පෙලේ සුපිරි සමාගම් 500ට අයත් සමාගම් සමඟ සබඳී ව්‍යාපාරික පළපුරුද්දක් ඇති ව්‍යවසායෙකි.

ඔහු පහත සඳහන් කමිටු සංවිධාන/සංවිධාන වල සේවය කරයි:

- ශ්‍රී ලංකාවේ නිරීත දිග විශ්ව විද්‍යාල කමිටුවේ සාමාජිකයෙකි.
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- අධ්‍යක්ෂ - සීමාසහිත ශ්‍රී ලංකා තානායම්
- කමිටු උපදේශක සාමාජික- ශ්‍රී ලංකා පාර්ශවය ව්‍යාපෘති කළමනාකාරී සමාගම

අපේ අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී

මොහමඩ් හිල්මි අබ්දුල් සත්තාර් මහතා

අපේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී මොහමඩ් හිල්මි අබ්දුල් සත්තාර් මහතා කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘත්තීය වේදියෙකු වේ.

ප්‍රධාන කුසලතා

- අමාත්‍යාංශ කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳ පුලුල් දැනුමක් ඇත.
- දැනට පවතින ජාතික සහ අන්තර්ජාතික දේශපාලන කටයුතු සහ යහපාලනය පිළිබඳ පූර්ණ දැනුමක් ඇත.
- ලිඛිත සහ වාචික සන්නිවේදන ඉදිරිපත් කිරීමේ නිපුණයකි.
- ශක්තිමත් මධ්‍ය කළමනාකාරිත්වය සහ මහජන සම්බන්ධතා පිළිබඳ නිපුණයකි.

වෘත්තීය පළපුරුද්ද

- අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම (2015 පෙබරවාරි සිට අද දින දක්වා)
- අධ්‍යක්ෂ - සී/ස. ප්‍රිමියර් TK20 (පුද්ගලික) සමාගම
- උපදේශක (ආයෝජන) -ඡාන්ෆාරි සමූහය-ඕමානය (2009 සිට 2011 දක්වා)
- අධ්‍යක්ෂ - නිවාස අමාත්‍යාංශය (2004 සිට 2005 දක්වා)
- ගරු උපදේශක - රාජ්‍ය වෙළඳ සහ වානිජ්‍ය අමාත්‍යාංශය යටතේ වන සමූපකාර තොග වෙළඳ සංස්ථාව (2002 සිට 2004 දක්වා)
- හවුල්කරු -TKS Trading , කොළඹ - (මෝටර් රථ බැටරි එකම ආනයනකරුවන් සහ රජයේ ප්‍රධාන සැපයුම්කරුවන්) (1995 සිට 2000 දක්වා)
- විධායක ගබඩා කළමණාකරු - සියන්කෝ සමූහයේ ජෙඩා වරාය ව්‍යාපෘතිය (1989 සිට 1993 දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩලය

තිසත් විජයගුණවර්ධන මහතා - නීතිඥ

තිසත් විජයගුණවර්ධන මහතා එංගලන්තයේ රීඩින්ග් විශ්ව විද්‍යාලයෙන් (University of Reading) නීති විද්‍යාව පිළිබඳව විද්‍යාපති (MSC) උපාධියක් ලබාගෙන ඇත. ඔහු සීමාසහිත චාන්සලර් උපදේශකවරු (පෞද්ගලික) සමාගමේ සහ ජේ.ටී.ඇස්. පවර් සමාගමේ අධ්‍යක්ෂ/උපදේශක වශයෙන් සේවය කරයි. ඔහු 2012 ඔක්තෝම්බර් 1 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කරනු ලැබීය.

ගාමිණී කුඩා බණ්ඩාර රත්නායක මහතා- Bachelor of Science, Master of Science – MAKS

ආර්. ගාමිණී කුඩා බණ්ඩාර රත්නායක මහතා ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ B.S.c. (කෘෂිකර්මය පිළිබඳ විශේෂිත) උපාධිය, ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධන ඉඩම් ප්‍රතිසංස්කරණ සහ පුනුණු කිරීමේ ආයතනය තායිවානයේ සහ පිලිපීනයේ MAKS (කෘෂි-කර්මය පිළිබඳ දැනුම් පද්ධතියේ කළමනාකාරිත්වය), වැජනින්ජන්, නෙදර්ලන්ත සහතිකය (පුනුණුවීමේ පාඨමාලාව) වෝටර් ෂෙඩ් පුනුණුවීම නියගයට තුඩුදිය හැකි ප්‍රදේශ වලට විශේෂිත යොමු කිරීමක් සමඟ ග්‍රාමීය සංවර්ධන ගුහාටි, ඇසෑම්, ඉන්දියා (සංකලිත ආසියා සහ පැසිෆික් සහ ජාතික ග්‍රාමීය සංවර්ධන ආයතනය, ඉන්දියා) ජාතික ආයතනය ඇතුළුව සහතික ලබා ගන්නා ලදි.

බදුල්ලේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩොන් වින්සන්ට් ඩයස් මහතා

ඩොන් වින්සන්ට් ඩයස් මහතා බදුල්ල එක්සත් ජාතික පක්ෂ සංවිධායක වශයෙන් 1975 තේරී පත්විය.

පළපුරුද්ද

- බදුල්ල එක්සත් ජාතික පක්ෂ සංවිධායක වශයෙන් 1975 තේරී පත්විය.
- බදුල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් 1977 තේරී පත්විය.
- ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමති ලෙස 1983 දී තේරී පත්විය.
- ඌව පළාත් සභාවේ එක්සත් ජාතික පක්ෂයේ 1993 වසරේ සාමාජිකයෙකි.
- 1993 සිට 1994 ITN හි ක්‍රියාකාරී අධ්‍යක්ෂක
- සභාපති ඖෂධ සංස්ථාව 1994
- 1993 - 2009 ඌව පළාත් සභාවේ සාමාජිකයෙකි.
- 2015 - අධ්‍යක්ෂ ලංකා සීනි සමාගම සහ ලංකා සළුසල

ඒ.වී. විරසේන මහතා මහතා - B com (විශේෂ) උපාධිය, ගණකාධිකාරී සහ මූල්‍ය කළමනාකරණය

වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ ගණකාධිකාරිවරුන්ගේ රාජ්‍ය මුල්‍ය ගිණුම් සංගමයේ සමාජිකත්වය දරයි
- උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව - (කාර්මික විද්‍යාලය)
- රාජ්‍ය මුල්‍ය කළමණාකරන ඩිප්ලෝමාව - (SLIDA)
- වරලත් ගණකාධිකරණය - අවසානය
- වෘත්තිය ඉංග්‍රිසි ඩිප්ලොමාව - (SLIDA)
- ව්‍යාපාර අධ්‍යනය ඩිප්ලොමාව කාර්මික විද්‍යාලය

ආචාර්ය නිහාල් සමරජීවලි - B.Sc. (Special Degree in Agriculture), MSc. (Agricultural Extension), PhD (Economics)

ආචාර්ය නිහාල් සමරජීවලි ප්‍රධාන පෙලේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අවුරුදු 35 කට වඩා වැඩි ක්‍රියාකාරී පළපුරුද්දක් ඇති ආර්ථික විද්‍යාර්තකයෙකු හා ප්‍රතිපත්ති සම්පාදකවරයකි. එසේම ඔහු අන්තර් ජාතික සංවිධාන වල උපදේශකවරයෙකු වශයෙන් සේවය කර ඇති අතර ආසියා සංවර්ධන බැංකුව සහ අන්තර් ජාතික කෘෂිකාර්මික සංවර්ධන අරමුදල (IFAD) වැනි ආයතනවල ඔහු විසින් ගැඹුරු පර්යේෂණ පත්‍රිකා ප්‍රසිද්ධ කර ඇත. එසේම සංවර්ධන සැළසුම් එසේම ප්‍රතිපත්ති විශ්ලේෂණ, ආයෝජන සහ වෙළඳ ප්‍රවර්ධනය අන්තර් ජාතික සම්මුති සාකච්ඡා සිදු කර ඇත.

වෘත්තීය පළපුරුද්ද

- ටෝකියෝ සිමෙන්ති කම්පැනි (ලංකා) PLC කොළඹ 03, ශ්‍රී ලංකා (අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ) 2015
- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (අධ්‍යක්ෂ ජෙනරාල් - ආයෝජන) 2013-2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශනය) 2001-2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (අධ්‍යක්ෂ - පර්යේෂණ) 1998-2001
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන්ෆීල්ඩ්, අඟලවත්ත, ශ්‍රී ලංකාව (කෘෂි ආර්ථික විද්‍යාඥ)
  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශනය) 1991-1998
- රබර් පර්යේෂණ මණ්ඩලය-නිවිතිගලකැලේ, මතුගම, ශ්‍රී ලංකා (පුහුණු කිරීමේ නිලධාරී) 1981-1991
- මහවැලි සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා (සහකාර පාංශු රසායනඥ) 1979-1981

මිහිරි සඵලත්වයෙ

රස බෙදහැරීමේ කාලය



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ප්‍රධාන කාර්යාල සංවිධානයේ ව්‍යුහය



සභාපති
නවින් අධිකාරම මහතා



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි
එම්. එම්. ඒ. ගප්හාර් මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - පැල්වත්ත
පී. එම්. ඒ. ඩබ්. කරුණාරත්න මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - කෙවනගල
ඒ. ඊ. අමුණුගම මහතා



කාමාන්‍යාධිකාරි - ප්‍රසම්පාදන
ඩබ්ලිව්. ඇම්. කරුණාරත්න මහතා



මූල්‍ය කාමාන්‍යාධිකාරි
එන්. එච්. එස් නවරත්න මහතා



මානව සම්පත්/නිරීක්ෂණ
එම්. ජයසොඩි මහතා



ජ්‍යෙෂ්ඨ කළමණාකරු ඉඩම් අත්පත් කර ගැනීම්
එස්. ජේ. රත්නායක මහතා

සංවිධානයේ ව්‍යුහය - පැල්වත්ත



පැල්වත්ත කළමනාකරණ කණ්ඩායම



පළමු පෙළ (වමේ සිට දකුණට)

එම්.ඊ. කොස්ගහකුඹුර මහත්මිය (ගණකාධිකාරි කළමනාකරණය) ඩී.එන්. දයාරත්න මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - කර්මාන්තශාලා) එම්.ජී.එන් සඳරුවනි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -මූල්‍ය) බී.ඒ.ජී.එන්. ඉලංගකෝන් මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම්) විමල් කරුණාරත්න (ප්‍රධාන මෙහෙයුම් නිලධාරි) ඩී.එල්.ඩී. ජයන්ත (සමාන්‍යාධිකාරි - ඉස්කාගාර) එම්.එම්.ඩී.එස්.එන්. පෙරේරා මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -කෘෂිකර්ම) ලිලී එම්. හෙට්ටිආරච්චි මෙතවිය (සංස්ථාපිත තොරතුරු විධායක නිලධාරි)

පළවනපෙළ (වමේ සිට දකුණට)

එස්. වීරසේකර මහතා (ගොල්ෆ් සහ හෝටල් සංකීර්ණ කළමනාකරු) ආර්.එම්.ජේ. බණ්ඩාර (නිෂ්පාදන කළමණාකරු -නිෂ්පාදනය) ඩී.ඒ. චන්ද්‍රරාජ් (විදුලි ඉංජිනේරු කර්මාන්තශාලා) කේ.එල්.ජේ. ප්‍රනාන්දු (කළමනාකරු මානව සම්පත්) එච්.එම්.අයි.ඒ.කේ. කටුගහ (නිෂ්පාදන කළමනාකරු කර්මාන්තශාලා) කේ.විදුරසිංහ (කළමනාකරු අස්වැන්න සහ මිලදී ගැනීමේ අංශය) එන්. විමලසේන (ප්‍රධාන විමර්ෂණ නිලධාරි) මාලින්ද ද සිල්වා (සහකාර කළමනාකරු EP) බී.ජී.ටී. ප්‍රසංග (කළමනාකරු මානව සම්පත් සහ පරිපාලන)

තුන්වනපෙළ (වමේ සිට දකුණට)

එල්.ඒ.සී. ප්‍රසන්න මහතා (කළමනාකරු NE) කේ.ඒ.ජී.එස්. සිසිවත් (ඉංජිනේරු කළමනාකරු-කර්මාන්තශාලා) ඩබ්.එස්.කේ. රත්නායක (කළමනාකරු- ඉඩම් සංවර්ධන) ඩී.එම්.එස්. බණ්ඩාර (කළමනාකරු-පිටස්තර වැවිලි කටයුතු) ඒ.පී. සුරංග (කළමනාකරු -කර්මාන්තශාලා) ඒ. මාසාච්චි (ප්‍රධාන අභ්‍යන්තර විගණක) ආර්.ඒ.එම්. චන්දන (සභ්‍ය විද්‍යාඥ) අනුර විජේසිංහ (කළමනාකරු -මිලට ගැනීම) කේ.ඒ.ජී. පලන්සූරිය (කේන්ද්‍රීය වතු) එම්.බී. චන්දන (ප්‍රධාන ඉංජිනේරු)

සංවිධානයේ ව්‍යුහය - සෙවනගල



V = අබාර්තුවක් ඇත.

සෙවනගල කළමනාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

ඇන්.ඒ. විමලරත්න මහතා (වැඩබලන යන්ත්‍රෝපකරණ කළමනාකරු), ජේ.ආර්. මාලගොඩ මහතා (සහකාර සාමාන්‍යාධිකාරී - සිවිල් ඉංජිනේරු සේවා), ඩී.කේ.ඩබ්ලිව්.ඩී සිල්වා මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලාව), සී.ඊ. අමුණුගම මහතා (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), කේ.ඒ. වොල්ටර් (සාමාන්‍යාධිකාරී), එච්.ඇම්.ඇස්. සමරවීර (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-කෘෂිකර්ම), ඇස්.ටී.ඩී. ප්‍රියන්ත (ප්‍රධාන ඉංජිනේරු)

පසු පෙළ දකුණේ සිට වමට

ඇස්.ඩබ්ලිව්. කොඩිතුවක්කු (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ජී.ඒ.කේ. නන්දවැව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඇම්. උපුල් කුමාර මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), අතුල සිරිදේව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඩී.සී. හෙට්ටිආරච්චි මහතා (ප්‍රධාන ඉංජිනේරු - බලශක්තිය සහ වැඩපොළ), ජයන්ත ෆර්නැන්ඩො මහතා (ජෙයෂ්ඨ කළමනාකරු - මානව සම්පත්), සපුමල් පිහිල්ලේගෙදර මහතා(කළමනාකරු - ප්‍රසම්පාදන සහ අලෙවිකරණය), ඇම්. ශාන්ත වීරසිරි මහතා (අභ්‍යාන්තර විගණක/විමර්ෂණකරු), කිංස්ලි පතිරණ මහතා (ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයා)

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

MPDC/RD/SDS/EBO
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

අප විසින් සිදුකරන ලද සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය, 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන්, ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන්, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙන්, පෙරකී දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයෙන් සහ වැදගත් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වාර්තාවකින් හා වෙනත් කරුණු පැහැදිලි කිරීමේ සටහන් වලින් ද සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා මැනවින් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ද, වංචනික හෝ සාවද්‍ය ක්‍රියා හේතුවෙන් සිදුවිය හැකි සැලකිය යුතු අවප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අවකාශ සැලසීම සඳහා අවශ්‍ය වේ යයි අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") නිශ්චය කරන අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් ද, මණ්ඩලය වගකිව යුතු ය.

විගණනයේ විෂය පථය සහ තත්වාගණනය කල මතයේ පදනම

අපගේ විගණනය පදනම්කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනය සිදු කළෙමු. විගණන ආචාර ධර්ම වලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අව-ප්‍රකාශ වලින් තොර වන බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කොට ක්‍රියාත්මක කිරීමටත්, එකී ප්‍රමිති මඟින් අපට නියම වී ඇත.
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම යනු 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකා රජය විසින් පවරාගන්නා ලද පැල්වත්ත සීනි කර්මාන්තායතන පීඑල්සී සමාගම සහ සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය යන සමාගම් සතු දේපල කළමනාකරණය සඳහා පිහිටුවන ලද සමාගමයි. එකී පවරා ගැනීමේ ක්‍රියාවලිය අතරතුර පැල්වත්ත සීනි කර්මාන්තායතනය සහ සෙවනගල සීනි කර්මාන්තායතනය සතුව පැවතී එකී දේපල මත පිහිටි නිශ්චල වත්කම් ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිසි බලධාරීන් වෙත පවරාදෙනු ලැබූ අතර පසුව නිසි බලධාරීන් වෙත පවරාදෙන ලද අදාළ සියලු වත්කම් හා බැරකම් 2012 ඔක්තෝබර් මස 01 වන දින සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී. තවද, එකී නිසි බලධාරීන් විසින් ඉටුකරන ලද අදාළ දේපල කළමනාකරණය සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරන ලද අතර එම අධ්‍යක්ෂ මණ්ඩලය දැනට මෙම සමාගම අඛණ්ඩව පවත්වාගැනීමේ වගකීම උසුලයි.
පැහැදිලි කළ නොහැකි කරුණු හේතුවෙන්, භෞතික ස්වරූපයෙන් පවරා ගත් වත්කම් හා වගකීම් බොහොමයක් පවරා ගත් දිනයේ තක්සේරු කිරීම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි නොමැති අතර, නිසි බලධාරීන් විසින් හැකි සෑම අවස්ථාවකදීම සහායක ක්‍රමවේද තුළින් එවැනි අගයන් ලබා ගැනීමට උත්සාහ කරන ලදුව, හැකි සෑම අවස්ථාවකදීම ඒවායින් සමහරක් විගණන සාක්ෂි වශයෙන් පිළිගනු ලැබීය. බොහෝකොට, ආරම්භක ශේෂයන් පිළිබඳ නිරවද්‍යතාව පසුව සිදුකළ කළමනාකරණ නියෝජනයන් සහ නිසි බලධාරීන් විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය වෙත හෙළි කරන ලද වෙනත් සහායක විගණන සාක්ෂි මත පදනම් විය. කෙසේ වුවද, අ හා ආ ඡේදවල සඳහන් කරුණු මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතුය.

මූල්‍ය ප්‍රකාශවල සඳහන් මූල්‍ය අගයන් හා අනාවරණයන් පිළිබඳව විගණන සාක්ෂි ලබාගැනීමට කාර්ය පටිපාටි අනුගමනය කිරීම විගණනයේ දී සිදු වේ. වංචනික හෝ සාවද්‍ය ක්‍රියා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල සැලකිය යුතු අවප්‍රකාශ ඇතුළත් වීමේ අවදානම තක්සේරු කිරීම ඇතුළු විගණකගේ තීරණය මත පදනම්ව එකී කාර්ය පටිපාටි තෝරා ගැනීම සිදු වේ. එකී අවදානම් තක්සේරු කිරීමේදී, විගණක විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල සඵලදායිත්වය පිළිබඳ මතයක් පළ කිරීමේ කාර්යය සඳහා නොව එක් එක් අවස්ථාගත තත්ත්වයන්ට ගැළපෙන විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවේද සැලකිල්ලට ගනු ලැබේ. අනුගමනය කරනු ලබන ගණකාධිකරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය විගණනය මඟින් තක්සේරු කරනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශ සමස්ත ඉදිරිපත් කිරීම ඇගැයීමට ලක් කිරීම ද කරනු ලැබේ.
අප විසින් රැස්කරගත් විගණන සාක්ෂි අපගේ විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා යෝග්‍ය වන බව අපි විශ්වාස කරමු.

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

මතය

අ. 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ("පනත") මගින් සමාගම විසින් පැල්වත්ත සහ සෙවනගල පරිශ්‍රයන්හි ඇති වත්කම් පවරා ගෙන ඇත. කෙසේ වෙතත්, අත්පත් කරගත් වත්කම්වල වටිනාකම හඳුනා ගැනීම සඳහා සමාගම විසින් සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කර නැත. තවද, 2011 නොවැම්බර් 11 දින වන විට කලින් අයිතිකරුවන්ගෙන් පවරා ඇති වත්කම් තීරණය කිරීම සඳහා සම්පූර්ණ ස්ථාවර වත්කම් ලේඛනයක් සමාගම සතුව නොමැත. පනතට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවල සමාගමට පවරා ඇති වත්කම් සාධාරණ වටිනාකමකින් හඳුනා ගැනීමට අවශ්‍ය විය.

ඉහත පරිදි ඉදිරි කටයුතු නොකොට, පැල්වත්ත අංශය විසින් කලින් අයිතිකරුවන්ගේ පොත් ශේෂයන් අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඒ අනුව ක්ෂයවීම් අනුපාතයන් අනුගමනය කර ඇති අතර, සෙවනගල අංශය විසින් දේපළ, පිරියත සහ උපකරණ, ආරම්භක බඩු තොග ශේෂයන්, දේපල, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම් ඇතුළු පෙර අයිතිකරුවන්ගෙන් පවරාගත් වත්කම් / වගකීම් ගණන් බලා නොමැත.

එබැවින්, වත්කම්වල වටිනාකම, එහි දේපල, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම සඳහා භාවිතා කරන ක්ෂයවීම් අනුපාත සහ ලාභය හෝ අලාභ ප්‍රකාශය සඳහා අය කරනු ලබන ක්ෂය කිරීමේ වියදම සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගැනීමට අපට නොහැකි විය.

පැල්වත්ත අංශයේ ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍රෝපකරණ, මෝටර් වාහන සහ කෘෂි උපකරණ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පැලවත්ත අංශයට තක්සේරු වාර්තා ලැබුණද, කළමනාකරණය විසින් එවැනි වාර්තාවල හඳුනාගෙන ඇති තොරතුරු වල නොගැලපීම් කිහිපයක් හේතුවෙන් එවැනි තක්සේරු කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැත. මෙම අංශයේ ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍රෝපකරණ, භාණ්ඩ තොග සහ මෝටර් වාහන සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලැබී ඇති අතර, කළමනාකරණය විසින් එවැනි වාර්තාවල අඩංගු තොරතුරු සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති නොගැලපීම් කිහිපයක් හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට පිරියත හා යන්ත්‍රෝපකරණ සම්බන්ධ වටිනාකම පමණක් ඇතුළත් කර ඇත.

එබැවින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් රජයේ ප්‍රදානය රු. 4,048,080,194/-ක් සාධාරණ වටිනාකම පිළිබිඹු නොකරන අතර, එය තහවුරු කිරීම සඳහා විකල්ප විගණන සාක්ෂි ලබා ගැනීමට අපට නොහැකි විය.

ආ. 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත මගින් පූර්ව හිමිකරුට / කොටස් හිමියන්ට වත්දි ගෙවීම සඳහා වත්කම් හා වගකීම් තක්සේරු කිරීම සම්බන්ධ ගැටලු විසඳීම සඳහා විනිශ්චය සභාවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය ලබා දී ඇත. පවරාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස හිමිකම් ඉල්ලීම්, ඉල්ලීම් හෝ අයැදීම් යනාදිය මගින් ඇතිවිය හැකි ඕනෑම වගකීමක් සම්බන්ධයෙන් එම විනිශ්චය සභාව විසින් කටයුතු කරනු ලැබේ. පනතේ අන්තර්ගතය හැරුණු විට, මෙම මූල්‍ය ප්‍රකාශනවල, එකී අත්පත් කර ගැනීම මත පැහැදිලිව දක්විය හැකි හිමිකම් හෝ වෙනත් වගකීම් තක්සේරු කිරීමට සමාගම සතුව කිසිදු ලේඛනයක් නොමැත.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව අප දරන මතයට අනුව, ඉහත අ හා ආ ඡේදවල සඳහන් යටතේ සඳහන් කරුණුවලින් මූල්‍ය ප්‍රකාශ මත ඇති කෙරෙන බලපෑමට හැරුණු කොට, සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳව ද එහි මූල්‍ය කාර්යසාධනය සහ එදිනෙන් අවසන් වර්ෂයේ මුදල් ප්‍රවාහ පිළිබඳව ද සැබෑවූත්, සාධාරණවූත්, අදහසක් මූල්‍ය ප්‍රකාශ මගින් ලබා දේ.

වෙනත් නෛතික හා නියාමක අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමකර ඇති පරිදි පහත සඳහන් ප්‍රකාශයන් සිදු කරමු:
අ. විගණන මතයේ පදනම, විගණනයේ විෂයය පථය හා සීමාවන් ඉහත සඳහන් කළ පරිදි වේ.
ආ. මාගේ මතයට අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් අප විසින් ලබාගෙන ඇති අතර අපගේ පරීක්ෂණයේදී පෙනී ගිය ආකාරයට සමාගම විසින් ගණකාධිකරණ වාර්තා මැනවින් පවත්වා ගෙන ගොස් ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූල වේ.

2015 මැයි 27
කොළඹ

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

සමස්ථ ආදායම් ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

	සටහන්	2014 රුපියල්	2013 රුපියල්
ආදායම	4	5,539,305,323	5,747,048,373
විකුණුම් පිරිවැය		(4,904,055,968)	(3,833,756,677)
දළ ලාභය/(අලාභය)		635,249,355	1,913,291,696
අමතර ආදායම් සහ ප්‍රතිලාභ	5	55,818,240	53,278,760
පරිපාලන වියදම්		(1,012,541,959)	(724,583,331)
මූල්‍ය වියදම	6	(50,047,247)	(32,313,316)
මූල්‍ය ආදායම	6	160,508,676	136,043,131
බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)	7	(211,012,935)	1,345,716,941
ආදායම් බදු (වියදම්)	8	60,175,975	(528,888,640)
වාර්ෂික ලාභය/(අලාභය)		(150,836,960)	816,828,301
බදු වලින් පසු මෙම කාල සීමාව තුල සමස්ත අමතර ආදායම		59,138,063	48,678,394
බදු වලින් පසුව මෙම කාල සීමාව තුල සමස්ත ආදායම/(වියදම)		(91,698,897)	865,506,695
කොටසක ඉපැයුම	9	(1,508,370)	8,168,283

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ව ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙතුවෙන්

වත්කම්	සටහන්	2014 රුපියල්	2013 රුපියල්
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	10	2,792,377,905	2,183,552,013
විලම්බිත බදු වත්කම්	8	86,066,655	1,442,469
		2,878,444,560	2,184,994,482
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	11	1,483,590,602	1,664,308,155
ජීව විද්‍යාත්මක වත්කම්	12	428,018,378	416,610,125
වෙළඳ සහ වෙනත් අය විය යුත්තන්	13	54,759,867	58,635,978
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්		131,039,684	129,350,987
ගොවියන්ගෙන් අයවිය යුතු ණය	14	930,162,482	764,202,986
ආයෝජන	15	1,733,873,465	1,568,902,957
මුදල් සහ ඒ හා සමාන දෑ	21	6,851,025	58,983,083
		4,768,295,504	4,660,994,271
මුළු වත්කම්		7,646,740,064	6,845,988,753
ස්කන්ධය සහ බැරකම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	1,000	1,000
රජයේ ප්‍රදාන	17	4,048,080,194	3,554,855,177
සමුච්චිත ලාභ		924,011,372	1,095,710,269
මුලු ස්කන්ධය		4,972,092,566	4,650,566,446
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්	19	412,697,156	396,335,846
පොලි සහිත ණය ගැනීම්	18	143,104,631	43,713,223
		555,801,787	440,049,069
ජංගම බැරකම්			
පොලි සහිත ණය ගැනීම්	18	440,401,880	64,855,479
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුත්තන්	20	1,156,140,806	1,181,460,446
ගෙවිය යුතු ආදායම් බදු		522,303,025	509,057,313
		2,118,845,711	1,755,373,238
මුලු ස්කන්ධය සහ බැරකම්		7,646,740,064	6,845,988,753

.....
සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන තබන ලද්දේ :

.....
අධ්‍යක්ෂක

.....
අධ්‍යක්ෂක

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

27 මැයි 2015
කොළඹ

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

ස්කන්ධයෙහි තත්ව වෙනස්වීම් ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්	රජයේ ප්‍රදානය රුපියල්	සමුච්චිත ලාභයන් රුපියල්	මුළු ගණන රුපියල්
2013 ජනවාරි 01 දී	1,000	3,579,880,177	230,203,574	3,810,084,751
රජයේ ප්‍රදාන නැවත ගෙවීම	-	(25,000,000)	-	(25,000,000)
පෙර අයිතිකරු වෙනුවෙන් සමාගම ගෙවන ලද මුදල	-	(25,000)	-	(25,000)
අවුරුද්ද තුළ ලාභය	-	-	816,828,301	816,828,301
අනෙකුත් සමස්ථ ආදායම්			48,678,394	48,678,394
අනෙකුත් මුලු සමස්ථ ආදායම්	-	-	865,506,695	865,506,695
සමස්ත ආදායම් එකතුව	-	-	865,506,695	865,506,695
2013 දෙසැම්බර් 31 දී	1,000	3,554,855,177	1,095,710,269	4,650,566,446
රජයේ ප්‍රදානය ආපසු ගෙවීම	-	(774,983)	-	(774,983)
කර්මාන්තශාලා සහ යන්ත්‍රාංකරණ ප්‍රත්‍යා ගණනය	-	494,000,000	-	494,000,000
ලාභාංශ ගෙවීම්	-	-	(80,000,000)	(80,000,000)
අවුරුද්ද තුළ අලාභය	-	-	(150,836,960)	(150,836,960)
අනෙකුත් සමස්ථ ආදායම්	-	-	59,138,063	59,138,063
සමස්ත ආදායම් එකතුව	-	-	(91,698,897)	(91,698,897)
2014 දෙසැම්බර් 31 දී	1,000	4,048,080,194	924,011,372	4,972,092,566

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

මෙහෙයුම් ක්‍රියාවලිය තුල (භාවිතයේ යෙදෙන) / පිටවෙන මුදල් ප්‍රවාහ	සටහන්	2014 රුපියල්	2013 රුපියල්
බදු ගෙවීමට පෙර ලාභය / (අලාභය)		(211,012,935)	1,345,716,941
ගැලපුම්,			
ක්ෂය වීම්	10	278,540,745	200,080,374
දේපල පිරියත හා උපකරණ විකිණීමෙහිදී අලාභ		-	12,325,714
මූල්‍ය ආදායම්	6	(160,508,676)	(136,043,131)
මූල්‍ය වියදම්	6	50,047,247	32,313,316
විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම්	19	121,540,071	77,094,525
අඩු වශයෙන් සංසරණය වන තොග වෙන් කිරීම්	11	8,194,045	-
බොල් ණය		1,919,319	-
බොල් ණය කපා හැරීම් ප්‍රතිස්ථාපනය කිරීම		(504,941)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		88,214,875	1,531,487,738
තොග (වැඩිවීම) / අඩුවීම		161,115,254	(810,680,834)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම්		(9,015,085)	(60,566,718)
ගොවි ණය අඩුවීම		(167,878,815)	(230,730,971)
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම)		(25,319,640)	727,555,782
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		47,116,590	1,157,064,997
ගෙවන ලද ආදායම් බදු		-	(21,273,794)
විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්	19	(46,040,698)	(25,499,179)
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා යොදවා ඇති ශුද්ධ මුදල් ප්‍රවාහය		1,075,892	1,110,292,024
ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ අත්පත්කර ගැනීමට		(236,522,276)	(263,126,467)
ස්ථාවර තැන්පත් වල ආයෝජන අඩුවීම / වැඩිවීම		(164,970,508)	(824,382,918)
දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් මුදල් ලැබීම්		3,771,000	-
ලැබුණු මූල්‍ය ආදායම්	6	160,508,676	136,043,131
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදවා ඇති මුදල් ප්‍රවාහය		(237,213,109)	(951,466,254)
මූල්‍ය ක්‍රියාවලිය තුල (භාවිතා කළ) /පිටවෙන මුදල් ප්‍රවාහය			
ලබාගත් ණය		-	(32,313,316)
ගෙවන ලද ණය	18	(10,932,248)	(9,671,298)
පූර්ව හිමිකරු වෙනුවෙන් කරන ලද ගෙවීම්		-	(25,000)
රජයේ ප්‍රදානය ආපසු ගෙවීම	17	(774,983)	(25,000,000)
කල්බදු ණය එකඟතාවය යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම	18	(18,687,116)	(1,914,878)
ගෙවන ලද පොලිය	6	(50,047,247)	(32,313,316)
ලාභාංශ ගෙවීම්		(80,000,000)	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවා ඇති ශුද්ධ මුදල් ප්‍රවාහය		(160,441,594)	(101,237,808)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්/අඩුවීම්		(396,578,812)	57,587,963
වසර ආරම්භයේ මුදල් සහ ඒ හා සමාන දෑ	21	4,331,205	(53,256,758)
වසර අවසානයේ මුදල් සහ ඒ හා සමාන දෑ	21	(392,247,607)	4,331,205

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

1. සංස්ථාපනික තොරතුරු

1.1 සාමාන්‍ය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ වාසිකව සංස්ථාපිත කරන ලද අතර සීමාසහිත සමාගමක් ලෙස මෙය ලියාපදිංචි කාර්යාලය ලෙස අංක 27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 04 දරන ලිපිනයේ පවත්වාගෙන යන අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන ඇඹිලිපිටිය සහ බුත්තල ප්‍රදේශවල පවත්වාගෙන යයි. පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසු පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සහ සෙවනගල සීනි කර්මාන්තායතනයේ වත්කම් සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම වෙත 2012 ඔක්තෝම්බර් 01 වැනි දින පවරන ලදී.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

මූල්‍ය ප්‍රකාශන කාලසීමාව තුලදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වුයේ උක් වගාව, සීනි සහ එතනොල් නිෂ්පාදනය හා අලවියේ යෙදීමයි.

1.3 නිකුත් කිරීමට බලය පැවරුම් දිනය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ 2014 දෙසැම්බර් 31 දින අවසන්වූ වසර වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 මැයි 27 වන දින කරන ලද නිශ්චය අනුව බලාත්මක කරන ලදී.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2. පොදු ප්‍රතිපත්ති

2.1 සැකැසීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය තත්ව ප්‍රකාශනය, ලාභ අලාභ ප්‍රකාශනය, අනෙකුත් සමස්ථ අදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධයෙහි වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් ඇතුලත් වේ.

මූල්‍යමය ප්‍රකාශන සැකසුම් කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මත වන අතර එසේ නොවන අවස්ථාවන් වල ඒ බව සඳහන් කර ඇත. මූල්‍යමය ප්‍රකාශනයේ අගයන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් (රු.) වලිනි.

2.1.1 අනුකූලතා ප්‍රකාශය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ මෙම මූල්‍යමය ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ ප්‍රමිතීන් (**SLFRS / SLKAS**) හා අනුකූලව සකසා ඇත. මෙම මූල්‍යමය ප්‍රකාශනය සැකසීම් සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව කර ඇත.

2.1.2 ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන් විසින් සමාගම අඛණ්ඩ පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ඇගයීමකින් අනතුරුව එය ඇවර කිරීමට හෝ එහි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට එරෙහිව තීරණය කරණලදි.

2.2 සුවිශේෂී ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සංක්ෂිප්තය

සමාගමේ මූල්‍යමය ප්‍රකාශනය සැකසීමෙහිලා භාවිතා කර ඇති සුවිශේෂී ගණකාධිකරණ ප්‍රතිපත්ති පහත දැක්වෙයි.

2.2.1 ක්‍රියාත්මක සහ නියෝජන මුදල් ඒකකය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සමාගමේ සියලුම වාණිජමය ගණුදෙනු සිදුකිරීමේ දී හා සටහන් කිරීමේදී එය මුලිකව යොදා ගනී. එමගින් සමාගමේ අර්ථික කටයුතු වල සක්‍යතාව මනාව පිළිඹිබුකෙරේ. විදේශ විනිමය හරහා කෙරෙන ගණුදෙනු, ගණුදෙනු දිනයේ පවතින නීත්‍යානුකූල විනිමය අනුපාතය අනුව ගණනය කරමින් රුපියල් වලට මාරු කරනු ලැබේ.

විදේශ විනිමය හරහා කෙරෙන ගණුදෙනු එම ගණුදෙනු දිනයේ පවතින නීත්‍යානුකූල විනිමය අනුපාතය අනුව මුල් අවස්ථාවේ සටහන් වන නමුත් සමාගමෙහි විදේශ මුදල් වලින් සටහන්වන මූල්‍යමය වත්කම් සහ බැරකම් වාර්ථාකරන දිනයේදී පවතින විනිමය අනුපාත අනුව නැවත ගණනය කරනු ලැබේ.

සියලුම විදේශ විනිමය ගණුදෙනු වලදී විනිමය අනුපාතයේ සිදුවන වෙනස්වීම් සමස්ත ආදයම් ප්‍රකාශනයේ විනිමය ලාභ හා අලාභ ලෙස අන්තර්ගත කර ඇත.

ඓතිහාසික පිරිවැයට විදේශ මුදලෙන් සටහන් වන මූල්‍යමය නොවන වත්කම් සහ වගකීම් ගණනය කෙරෙනුයේ එම ගණුදෙනු කර දිනයේ පැවතුනු විනිමය අනුපාතය අනුවය. සාධාරණ අගයකට නිශ්චය කරන ලද විනිමය අනුපාත අනුව විදේශ මුදලින් අගය කරන ලද මූල්‍යමය නොවන දෑ ගණනය කිරීම සාධාරණ අගයක් සේ නිශ්චය වුනු දිනයේ පැවතුනු විනිමය අනුපාත ඔස්සේ ඉටු කරනු ලැබේ. මූල්‍යමය නොවන දෑ නැවත පරිවර්තනය කිරීමේදී ඇතිවන ලාභ හෝ අලාභ සලකනුයේ එම වත්කම්වල සාධාරණ අගයන්ගේ වෙනස්වීම් කරණකොටගෙන සිදුවන ලාභ හෝ අලාභ හඳුනාගැනීමට සාපේක්ෂවය.

(මෙයින් අදහස් වන්නේ වෙනත් සමස්ත ආදයම්, ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබන විදේශ මුදලින් රුපියල් වලට හැරවීම නිසා සිදුවන ලාභ සහ අලාභවල සාධාරණ අගයන්ට අදාල භාණ්ඩ වල මෙම හැරවීම් ආශ්‍රිතව මතුවන මිල වෙනස්වීම්වල සාධාරණ අගයන්ද වෙනත් සමස්ත ආදයම්, ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලැබෙන බවයි.)

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.2 ආදායම හඳුනාගැනීම

ආදායම හඳුනාගැනීමේ දී එමඟින් සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඇති අවකාශය සලකා බලන අතර එය මුදල් වශයෙන් ලැබීම සලකා නොබැලේ. ආදායම මිනුම් කිරීම සඳහා ලැබී තිබෙන හෝ ලැබෙන්නට තිබෙන පිළිසිටුවේ සාධාරණ අගය ගිවිසුම්ගත ගෙවීමේ නියමයන්ගේ නිර්වචයන් සමග සලකා බැලීමක් කෙරේ. මෙයට බදු සහ තීරු බදු ඇතුලත් වන්නේ නැත. සමාගම ආදායම් තක්සේරු කිරීම සඳහා ඒවා තුල සමාගම ප්‍රමුඛ හෝ නියෝජිත ලෙස ක්‍රියාකරන්නේ දැයි නිර්නය කිරීම සඳහා විශේෂිත නිර්ණායකයන් භාවිතා කරයි. සමාගම එහි සියළු ආදායම් තක්සේරු කිරීම සඳහා ප්‍රමුඛ හෝ නියෝජිත ලෙස හඳුනා ගැනීමට ප්‍රථම එය පහත සඳහන් නිර්ණායකයන් සමග අනුකූල වන බවට සහතික කර යුතුවේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩයක් විකිණීමෙන් පසු එය ආදායමක් වශයෙන් සලකනු ලබන්නේ එහි අවදානම් සහ හිමිකමේ ප්‍රතිලාභ, හිමිකරුවෙකුට අයත් වන කළමනාකරණ ආතුලිත වීමකින් හෝ සාධනීය පාලන අයිතියකින් සමාගම තොරවී, ගැණුම්කරුට පැවරී ඇති විටය.

පොලී ආදායම්

කාලීන ණය සහනයක් යටතේ මිලට ගෙන විකිණීමට ප්‍රදර්ශනය කර තිබෙන භාණ්ඩ ණය පදනමක් යටතේ විකිණීමට අදලව වැයවන වියදම සහ උපයන ආදායම ගණනය කරනුයේ සාධනීය පොලී අනුපාතය අනුවය. සාධනීය පොලී අනුපාතය අනාගතයේ මේ වෙනුවන් දරන වියදම් හෝ ලබන ආදායම් වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරණ අගයට නිසියාකාරව ගැලපෙන්නට සලස්වන සාධකයයි. පොලී ආදායම් ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම යටතේ හුවා දක්වනු ලැබේ.

වත්කම් විකිණීමේදී ලාභ සහ අලාභ

වත්කම් විකිණීමේදී ලාභ හෝ අලාභ ගණනය කරනුයේ ශුද්ධ විකුණුම් මිල වත්කමේ ධරණ අගය හා සැසඳීමෙනි. ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ අගයක් සේ මෙය "අනෙකුත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාදෙනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් විකුණූ විට ප්‍රත්‍යාගණනය කිරීමෙන් එළඹී ඇති වැඩි අගය ආදායම් ශීර්ෂය යටතට පැවරීමක් කෙරේ.

2.2.3 බදු අය කිරීම

වර්තමාන බදු

ආදායම් බදු සමන්විත වනුයේ වර්තමාන බදු වලිනි. ස්කන්ධය තුල සෘජුව හඳුනාගනු ලබන දෑ වලට අදල බදු ස්කන්ධය තුල අඩංගු අතර මීට අමතර දෑ වලට අදල ආදායම් බදු වියදම් ලාභ / අලාභ යටතේ හඳුන්වාදෙනු ලැබේ.

වර්තමාන බදු යනුවෙන් අදහස් කරනුයේ අදාල කාල සීමාවට ගෙවීමට අපේක්ෂිත බද්දට යටත් වන අදායම මත පදනම්ව හා කාල සීමාවට අදාල ආදායම් බදු අනුපාත යොදා ගනිමින් වාර්ථා කරන දිනයට හා පෙර වසරවලට ගෙවිය යුතුවන බදු ගැලපුම්ය.

විකුණුම් බදු

පහත සඳහන් අවස්ථාවල හැරෙන්නට ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බදු වලින් තොරව සලකනු ලැබේ :

* භාණ්ඩයක් මිලට ගැනීමේදී ගෙවීමට සිදුවන විකුණුම් බද්ද බදු බලධාරියාගෙන් නැවත ලබාගැනීමේ හැකියාවක් නොමැති අවස්ථාවකදී එම බද්ද භාණ්ඩයේ මිලට අයත් වන බවට සලකනු ලැබේ.

* ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ හි විකුණුම් බද්ද ඇතුලත්ව ඇතිවිටදී

බදු බලධාරියාගෙන් නැවත ලබාගත හැකි හෝ බලධාරියාට ගෙවිය යුතුවන ශුද්ධ බදු ප්‍රමාණය මූල්‍යමය තත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු හෝ ලැබිය යුතු අගයන් වශයෙන් දක්වනු ලැබේ.

විලම්බිත බදු

විලම්බිත බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වත්කම් හා වගකීම්වල ශේෂ හා බදු ගණනයේදී වත්කම් හා වගකීම් වල ශේෂ අතර තාවකාලික වෙනස මත බදු අනුපාත වල බලපෑම සටහන් කර ඇත.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්
2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.4 වියදම්

ව්‍යාපාරය කරගෙන යාමේදී සිදුවන වියදම් සියල්ලක්ම එම කාල සීමාවේ ලාභය ගණනය කිරීම සඳහා ආදයමට බැර කර ඇත.

පිලිසකර කිරීම් සහ ප්‍රතිසංස්කරණය කිරීම් වලට අයත් වියදම් එම වියදම සිදුවූ කාල සීමාවේ ලාභ අලාභ වලට අයකරනු ඇත.

2.2.4.1 ණය ගැණුම් පිරිවැය

ණය ගැනීමට අයත් වියදම් වන අතර **එම වියදම එම වත්කම මිලදී ගැනීමට, ගොඩනැගීමට, හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව දායක වන්නේ නම් එය එම වත්කමේ මිලට අන්තර්ගත කරන අතර ඉන් බැහැර අවස්ථාවන්හිදී එම වියදම එම කාලව සීමාවේ වියදමක් ලෙස හඳුනාගැනේ.**

2.2.4.2 මූල්‍ය වියදම්

මූල්‍ය වියදමට අයත්වන්නේ ණයට ගෙන තිබෙන මුදලට අයවන පොලි වියදමයි. මෙය සෘජුව ලාභ අලාභ සේ හඳුනාගැනේ. වත්කම මිලදී ගැනීමට, ගොඩනැගීමට, හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව දායක නොවන්නේ නම් එය ලාභ අලාභ ගිණුමේ සඵලදයී පොලි ක්‍රමවේදය අනුව ගිණුම්ගත කෙරේ.

2.2.5 දේපළ, පිරියත සහ උපකරණ

හිමි වත්කම්

දේපළ, පිරියත සහ උපකරණ වලට මනිනු ලබන්නේ එවා අත්පත් කර ගැනීමේදී දරු පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හා එහි සමුච්චිත හානිකරණ අලාභ ඇත්නම් ඒවා අඩුකිරීමෙන් පසුවය.

දේපළ, පිරියත සහ උපකරණ වල පිරිවැයට ඇතුලත් වන්නේ **ඒවා අත්පත් කරගැනීම සඳහා සෘජුවම දරූ වියදම්ය. ස්වයං ලෙස ගොඩනගන ලද වත්කම්** වල පිරිවැයට **ඇතුලත් වන්නේ ද්‍රව්‍යය සහ සෘජුව ලබාගත් ශ්‍රමයයි. වත්කම් ක්‍රියාකාරී තත්වයට ගෙනයෑම සඳහා වන වෙනත් සෘජුවම බලපාන** පිරිවැය, **එහි බලාපොරොත්තු වන භාවිතය සහ උපකරණ ගලවා ඉවත් කිරීම සඳහා වන** පිරිවැය **සහ වැඩපල භූමිය පිහිටා ඇති ස්ථානය නැවත යථා තත්වයට පත්කිරීම සඳහා ලබා ගත් ණය සඳහා පොලී, අදල උපකරණ සංකලනය සඳහා මෘදුකාංග මිලට ගැනීම, එම උපකරණයේ ප්‍රාග්ධන කොටසක දේපළ, පිරියත සහ උපකරණ අඩංගු** වත්කමක **කොටසක ඵලදයී ජීවිත කාලය වෙනස් වූ විට ඒවා වෙනත්** වත්කම් **ලෙස ගණනය කරනු ලැබේ.**

කල්බදු වත්කම්

මූලාරම්භයේදී කල් **බදු** මත අයත්කරගත් වත්කමක්, වත්කමක් ලෙස **නිගමනය කිරීමේදී සහ හෝ විශේෂිත වත්කම හෝ වත්කම් සැකසීමේදී එකී වත්කම් භාවිතා කිරීමට අයිතියක් තිබේදැයි තීරණය කිරීම,** කල් **බදු දුන්** වත්කමේ **අයිතියට සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මූල්‍ය බදු සමාගමේ අයිතියට යුතු ප්‍රමාණයක් මාරු කරන විට** කල් **බදු ආරම්භයේදී** කල් **බදු දේපළේ සාධාරණ** වටිනාකමට ප්‍රාග්ධනය කරනු ලැබේ. ලාභ / අලාභ ප්‍රකාශනයේ මූල්‍ය අයකිරීම් හඳුනාගත්තේ මූල්‍යමය වටිනාකමෙන්ය.

වත්කමේ භාවිතා කළ හැකි ජීවිත කාලය මත කල් **බදු වත්කම් ක්ෂය කෙරේ. කෙසේ වෙතත් බදු කාලය අවසානයේදී සමාගමට අයිතිය ලබා ගැනීම සාධාරණ හේතුවක් නොමැතිව ඇස්තමේන්තු ගත කරන ලද කෙටිම භාවිතා කළ හැකි කාලය සහ බදු කාලය මත වත්කම් ක්ෂය කරනු ලැබේ.**

කල්බදු ගෙවීම් මෙහෙයුම් ලාභයේ හෝ අලාභයේ වියදම් ලෙස කල්බදු කාලසීමාවේ සෘජුවම හඳුනාගනු ලැබේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

පසු කාලීන වියදම්

දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් නැවත තැබීමේදී හඳුනාගනු ලබන්නේ එහි තුළ ඇති ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගමට ලැබෙනවානම් එහි වටිනාකම සුදුසු ලෙස මැනිය හැකිය. නැවත සවි කල කොටසේ රැගෙන යන වටිනාකම හඳුනා නොගැනීම පහත සඳහන් හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලවය.

දේපල, පිරියත සහ උපකරණ වල එදිනෙදා සේවා වියදම් ලාභ අලාභයේදී හඳුනාගනු ලබන්නේ වියදමක් ලෙසය.

හඳුනානොගැනීම්

දේපල, පිරියත සහ උපකරණවල ඉදිරියට ගෙන ශේෂය ඒවා බැහැර කිරීමේ දී හඳුනාගනු ලබන අතර හෝ එය භාවිතයේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොමැති නම්, ලාභ සහ අලාභ හඳුනාගැනීමත් නොමැති අතර, ලාභ, අලාභවල හඳුනාගැනීම ආදායම් වශයෙන් වර්ගීය කරනු නොලැබේ.

ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය ක්‍රමයේදී ලාභ හා අලාභ හඳුනාගනු ලබන්ගේ සෑම දේපලකම ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය මත අතර මෙය වත්කමෙන් ගලා එන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය මත සමීපව පිළිඹිඹු කරයි.

මූල්‍ය කල් බදු යටතේ තිබෙන වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල් බදු කාලසීමාව සහ අයිති වත්කම්වලට සමාන භාවිත කල හැකි කාලය මතය. එසේ නොමැතිව බදු කාලය අවසානයේදී සමාගමට එහි අයිතිය ලැබේය යන විශ්වාසය මතය. නිදහස් ඉඩම් ක්ෂය නොකෙරේ.

වත්කමක ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතා කිරීමට ලැබුනු පසුව අතර අවසන් වන්නේ වත්කම් තමන් සතු ලෙස වර්ගීයකරණය කර විකිණීමට හෝ හඳුනානොගෙනීමේ කොටසකට අයත්වූ විටදීය. වත්කමේ මතුපිට වටිනාකම්, භාවිතා කළ හැකි කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය නැවත විමසා බලන්නේ සෑම මූල්‍ය වර්ෂයේ අවසානයේ දී වන අතර අවශ්‍ය නම් නිසිලෙස සකස් කෙරේ.

2.2.6 තොගය

තොගයක වටිනාකම ගණනය කරනු ලබන්නේ එහි පිරිවැයට කල් ඉකුත් වූ හා සෙමින් සංසරණය වන තොග වලට නිසි ගැලපුම් කල විට ලැබෙන වටිනාකම හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අවම අගයටය.

තොග වත්මන් ස්ථානයට සහ තත්වයට ගෙන ඒම සඳහා වැයවූ මුදල ගණනය කිරීම සඳහා පහත දැක්වෙන සමීකරණය භාවිතාවේ :

නිෂ්පාදන තොග	- ශේෂ පත්‍රය සැකසුනු දිනය දක්වා වැය වුනු අමතර වියදම් ඇතුළු සියළු සෘජු වියදම්
උක් ගස් නගාසිටුවීම සඳහා	- ශේෂ පත්‍රය සැකසුනු දිනය දක්වා වැය වුනු අමතර වියදම් සහ පැල තවානට අයත් වියදම් ඇතුළු සියළු සෘජු වියදම්
අනෙකුත් තොග	- සැබෑ වියදම
මාර්ගස්ථ තොග	- සැබෑ වියදම

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.7 මූල්‍ය මෙවලම් - ආරම්භක හඳුනාගැනීම සහ ඉන් අනතුරුව කෙරෙන අගය කිරීම

i) මූල්‍ය වත්කම්

ආරම්භක හඳුනාගැනීම සහ අගය කිරීම

LKAS 39 ප්‍රමිතය තුල ලාභ/අලාභ හරහා සාධාරණ අගයන් සහිත වන මූල්‍යමය වත්කම් ,ණය සහ ලැබිය යුතු ණය, කල්පිරීමට ඇති ආයෝජන, විකිණීමට ඉදිරිපත්කර ඇති වත්කම්, ප්‍රායෝගික ඉදිරි ආරක්ෂාව සඳහා යොදවන ඉදිරි ආරක්ෂක මෙවලම් ආදිය වේ. සමාගම තම මූල්‍යමය වත්කම්වලට අදල වර්ගීකරණය ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කරයි.

ලාභ/අලාභ හරහා සාධාරණ අගයන් යටතේ හඳුනාගනු ලබන මූල්‍යමය වත්කම් හැරෙන්නට අන් සියළු මූල්‍ය වත්කම්වල සාධාරණ අගයන් ගණුදෙනු වියදම් සමග මුල් වශයෙන් හඳුනාගනු ලැබේ.

වෙළඳපොලේ නියමයන් හෝ සම්මතයන් අනුව යම් කාලසීමාවක් ඇතුලත ගණුදෙනුවකට ලක්විය යුතු වත්කම් (විධිමත් ආරයේ විකුණුම්) විකුණුම් දිනයේදී (එනම් සමාගම විකිණීමට හෝ මිලදී ගැනීමට තීන්දු කල දිනයේදී) හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍යමය වත්කම්වලට මුදල්, කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ අනෙකුත් අයවිය යුත්තන්, ණය, වෙළඳපොලේ අප්‍රකාශිත මූල්‍යමය මෙවලම් සහ ව්‍යුත්පන්න මූල්‍යමය මෙවලම් අයත්වේ,

මූල්‍යමය වත්කම්වලට අදල මිණුම් ඒවායේ වර්ගීකරණය අනුව වෙනස්වේ, ඒවා පහත දැක්වෙන පරිදි විස්තර වේ :

ණය හා අයවිය යුත්තන් / ලැබිය යුතු දෑ

ණය සහ අයවිය යුතු දෑ වෙළඳපොලේ අප්‍රකාශිත ස්ථිර නිශ්චය කර හැකි ගෙවුම් සහිත ව්‍යුත්පත්ත නොවූ මූල්‍යමය වත්කම් වෙයි. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, මෙවැනි වත්කම් මිණුම් කරනු ලබන්නේ සැබැවින් බලාත්මක වන පොලි අනුපාත ක්‍රමවේදය අනුව කොටස් කල මිලෙන් හානිකරනය වීම අඩුකලාට පසුවය. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීම සඳහා සාධනීය පොලී අනුපාතය අනුවය. අන්තර්ගත ක්‍රමක්ෂය වශයෙන් අත්පත්කර ගැනීමේ වියදම්, ගාස්තු යනාදියට ලැබෙන වට්ටම් සලකා බලනු ලැබේ. සාධනීය පොලී අනුපාත කොටස් කිරීම ආදයම් ප්‍රකාශනයේ මූල්‍ය ආදයම් යටතේ හඳුනාගනු ලැබේ. හානිකරනය හරහා සිදුවන අලාභ ආදයම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබෙන්නේ ණය සඳහා මූල්‍ය වියදම් හෝ විකුණුම්වලට අදල වියදම් හෝ අනෙකුත් අයවිය යුත්තන්ට අදල මෙහෙයුම්වල වියදම් ඔස්සේය.

හඳුනාගැනීම අවසන් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ එවැනි වත්කමකින් කොටසක් හෝ එවැනි වත්කම් සමූහයකින් කොටසක්) හඳුනාගැනීමෙන් තොර වන්නේ:

* එම වත්කමෙන් මුදල් ප්‍රවාහයන් හී අයිතිය ලබාගැනීමට අහෝසිවූ විට

* සමාගම එම වත්කමේ මුදල් ප්‍රවාහයන් හ අයිතිය පවරා ඇති විටෙක හෝ කිසිම භෞතික ප්‍රමාදයකින් තොරව ලබාගත් මුදල් ප්‍රවාහය තුන්වැනි පාර්ශවයකට විනිවිද එකඟතාවයක් යටතේ පැවරීමට වගකීමක් භාරගෙන තිබෙන විටෙක සහ

(අ) සමාගම වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විටෙක

(ආ) සමාගම වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා නොමැතිව නමුත් එහි පාලනය පවරා ඇති විටෙක

සමාගම වත්කමක මුදල් ලබාගැනීමේ අයිතිය පවරා ඇති විටෙක හෝ විනිවිද එකඟතාවයක් යටතේ පැවරීමට වගකීමක් භාරගෙන තිබෙන විටෙක සමාගම විසින් එම වත්කමේ අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති ප්‍රමාණය පිළිබඳව ඇගයීමක යෙදෙනු ලැබේ. එම ඇගයීමේදී සමාගම සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා නොමැති බව හෝ පාලනය පවරා නොමැති බව වැට වුවහොත් සමාගම එම වත්කම තම වගකීම යටතේ පවතින ප්‍රමාණය අනුව හඳුනාගැනීමක් කරයි. මේ අවස්ථාවේදී සමාගම ඒ හරහා පවතින යම් බැරකමක්ද හඳුනාගනී, පවරනු ලැබූ වත්කම සහ ඊට අදල බැරකම සමාගමේ හිමිකමට අයත්වී පවතින වගකීම අනුව ගණනය කරනු ලැබේ.

පවරනු ලැබූ වත්කම සම්බන්ධව ඇපයක ස්වභාවයෙන් යම් වගකීමක් තවමත් පවතී නම් එය ගණනය කරනුයේ එහි උපරිම අගය සහ එය නිසා නැවත ගෙවීමට සිදුවිය හැකි උපරිමය සලකා බැලීමෙන්ය.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

ii) මූල්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්ථා කරන දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ වත්කම් සමූහයක් හානි වීම පිළිබඳ යම් සාධාරණීය සාක්ෂියක් තිබේදැයි සමාගම තක්සේරු කර බලයි. මූල්‍ය වත්කමක් හානි වී ඇති බවට තීන්දු වන්නේ එය මුලින් හඳුනාගත් පසුව යම් සිද්ධීන් මාලාවක් කරණ කොටගෙන එය හානි වූ බවට සාධනීය සාක්ෂ්‍යක් ඉදිරිපත් වුවහොත් ("අලාභ සහගත සිද්ධියක්") පමණි. මෙම අලාභ සහගත සිද්ධිය කරණ කොටගෙනඑම වත්කමේ හෝ වත්කම් සමූහයේ තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහය වෙත විශ්වාසවන්තව ගණනය කල හැකි බලපෑමක් සිදුවී ඇති විය යුතුවේ. හානිකරනය වීමේ සාක්ෂ්‍ය වශයෙන් ණයකරුවන් කිහිපදෙනෙකු මූල්‍යමය අපහසුතාවයන්ට ගොදුරුවීම, මුල් ධනය හෝ පොලිය නොගෙවීම හෝ අදුවනතාවය, ඔවුන් දැනුවත් බවට පත්වීමේ හැකියාව පෙන්නුම් කිරීම, නිරීක්ෂණය කරන දත්ත මගින් අනාගත මුදල් සංසරණයන්හි සැලකිය යුතු පසුබැසීමක් ඇතිවිය හැකි බවට තක්සේරුවීම සැලකිය හැක. (මීට හිඟ මුදලේ සැලකිය යුතු වෙනස්වීම් හෝ ගෙවීම් නොකිරීමට තුඩුවන ආර්ථික තත්වයන් නිර්මාණය වීම ඇතුලත්වේ,)

මූල්‍ය වත්කම් වල හානිකාරතය වූ විටදී ප්‍රකාශ කරනු ලබන්නේ ක්‍රමකෂය පිරිවැය ක්‍රමයටය. සමාගම පළමුව තක්සේරු කරන්නේ තනිව පෙන්නුම් කරන මූල්‍ය වත්කම් වල අරමුණු කරන හානිකරණය වීමේ සාක්ෂි තිබේදැයි යන්න හෝ තනිව පෙන්නුම් කරන මූල්‍ය වටිනාකම් වල එකතුවය. තනිව තක්සේරුකරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණය නොවීමේ සාක්ෂි නොමැති බවට සමාගම විසින් තීරණය කළහොත්, පැහැදිළි හෝ අපැහැදිළි වූවත්, එක හා සමාන ණය අවදානමක් මූල්‍ය වත්කම් සමූහයක ඇතුළත්වේ. හානිකරණය සඳහා එකතුව තක්සේරු කෙරේ. වත්කම් තනිව හානිකරනය කිරීම සඳහා තනිව තක්සේරු කිරීමේදී සහ එයට හානිකරන නැතිවීමේදී හෝ හඳුනාගැනීම පවත්වාගෙන යෑමේදී හානිකරන එකතුව තක්සේරු කිරීමක් ඇතුළත් නොවේ.

හානිකරණ අලාභයක් සිදුවී ඇති බවට සාක්ෂි තිබේ නම්, එවිට හානිකරන අලාභය මනිනු ලබන්නේ වකකමෙහි ඉදිරියට ගෙන යන ශේෂය සහ ඉදිරි මුදල් ප්‍රවාහයේ පවතින වර්තමාන වටිනකම මතය. (දැනටම සිදුනොවූ අනාගතයේදී බලාපොරොත්තු වන ණය අලාභ හැර) පවතින ඇස්තමේන්තුගත කළ ඉදිරි මුදල් ප්‍රවාහ වත්කම් වල බලපාන අනාගත පොලි අනුපාත වලින් අවම කරනු ලබන අතර ණය මුදලක වෙනස්වනසුළු පොලි අනුපාතයන් තිබේ නම්, හාණිකරණ පාඩුව මැනිමේදී අවකලයුතු වන්නේ සපල දයි පොලී අනුපාතිකයෙනි.

වත්කමක ගෙන යන ලද ගණන අඩු කරනු ලබන්නේ දීමනා ගිණුමක් තුලින් වන අතර අලාභය හඳුනාගනු ලබන්නේ ලාබ සහ අලාභ තුලදීය. ලැබීම් සහ එයට සම්බන්ධ දීමනා කපා හරින්නේ අනාගතයේදී අයකර නොගත හැකි නියම බලාපොරොත්තු ඇති විටදී සහ සියලුම අතිරේක බලාපොරොත්තු ලබාගත් විට හෝ සමාගම මාරු කළ විටදීය.

පසු අවුරුද්දකදී ඇස්තමේන්තු ගත කළ හානිකරන වීමක් සිදුවීම හේතුකොටගෙන ඉහත හඳුනාගත් හානිකරන නැතිවීම අඩු කර ගත හැක්කේ, දීමනා ගිණුම නිසිලෙස වෙනස් කිරීමෙනි. අනාගත කපා හැරීම පසුව සොයාගත හොත් සොයාගැනීම ලාබ හෝ අලාභයේ පෙන්නුම් කෙරේ.

මූල්‍යමය වත්කම්

LKAS 39 ප්‍රමිතියේ විෂය පථය (SCOPE) තුළ සාධාරණ අගයන් සහිත මූල්‍යමය වත්කම් වශයෙන් වර්ගීකරණය වන්නේ සාධාරණ අගය මත ලාභ/අලාභ, ණය සහ ණයට ගැනීම් හෝ ප්‍රායෝගික ඉදිරි ආරක්ෂාව සඳහා යොදවන ඉදිරි ආරක්ෂක මෙවලම් ආදිය වේ. සමාගම තම මූල්‍යමය වත්කම්වලට අදාල වර්ගීකරණය ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කරයි. සියළු මූල්‍යමය බැරකම් මුල් වශයෙන් සාධාරණ අගයන් හරහා හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් අදාලව ඒවාට සම්බන්ධව සෘජුව හඳුනාගත හැකි ගණුදෙනු වියදම්ද ඊට එකතු කරනු ලැබේ,

වෙළඳාම්, අතෙකුත් ගෙවීම්,බැංකු අයිරාවන් සහ වෙනත් ණය සමාගමේ මූල්‍යමය බැරකම්වලට ඇතුලත් වේ.

අනතුරුව කරන්නට යෙදෙන මිණුම්

මූල්‍යමය බැරකම්වලට අදාල මිණුම් ඒවායේ වර්ගීකරණය අනුව වෙනස්වේ. ඒවා පහත දැක්වෙන පරිදි විස්තර වේ.

ණය සහ ණයට ගැනීම්

ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, පොලි සහිත ණය සහ ණයට ගැනීම් මිණුම් කරනු ලබන්නේ සැබෑවින් බලාත්මක වන පොලි අනුපාත ක්‍රමවේදය අනුව කොටස් කලාට පසුවය. බැරකම් හඳුනාගැනීම අවසන් කරන අවස්ථාවේදී සහ සැබෑ බලාත්මක පොලි අනුපාතය අනුව කොටස් කරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශණයේ ලාභ සහ අලාභ හඳුනාගැනේ,

ක්‍රමක්ෂය ගණනය කිරීමට, අත්පත් කරගැනීමට වැය වුනු මුලික ගෙවීම, වට්ටම් සහ ගාස්තු හෝ පිරිවැය සැබෑ බලාත්මක පොලි අනුපාතයට අන්තර්ගත වන ආදායම් ප්‍රකාශණයේ මුදල් සැපයීමේ වියදම් යටතේ මෙම කොටස් කිරීම පෙන්නුම් කෙරේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

හඳුනාගැනීම අවසන් කිරීම

මූල්‍යමය බැරකමක වගකීම සම්පූර්ණ කල විට,අහෝසි කල විට හෝ අවසන්වූ විට එම බැරකමේ හඳුනාගැනීම අවසන් බවට සැලකේ. පවතින මූල්‍යමය බැරකමක් එම ණය සපයන්නා විසින්ම වෙනස් මුදල් බැරකමකින් ආදේශ කරන විට හෝ යම් බැරකමක කොන්දේසි සහ නියමයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් කරන විට එම වෙනස් කිරීම මූලික බැරකමේ හඳුනාගැනීම අවසන් කරන සාධකය සැටියට සලකා අළුත් ගණුදෙනුව නව බැරකමක් හැටියට හඳුනාගනු ලැබේ, අදාල ධාරණ අගයන්වල වෙනස ආදායම් ප්‍රකාශණයේ පෙන්නුම් කරනු ලැබේ.

2.2.8 මුදල් හා සමාන මෙවලම්

මුදල් හා සමාන මෙවලම් සමන්විත වන්නේ මුදල් ශේෂ සහ මුදල් තැන්පතු වලිනි. මුදල් සංසරණ ප්‍රකාශණයට අදාලව, සමාගමේ මුදල් කළමණාකරණයේ වැදගත් කොටසක් වන ඉල්ලුම් කරන අවස්ථාවක ආපසු ගෙවිය යුතුවන බැංකු අයිරාවන්ද මුදල් හා සමාන මෙවලම් ගණයට අඩංගුවේ.

2.2.9 මූල්‍ය නොවූ වත්කම් හානිකරණය

සමාගමේ මූල්‍යමය නොවන වත්කම් හානිකරණයකට ලක්වී ඇත්දැයි නීර්ණය කිරීම සඳහා සෑම වාර්ථා කිරීමේ දිනක් පාසා ඒවායේ ධාරණ අගය සමාලෝචනයට ලක් කෙරේ. හානිකරණයකට ලක්වී ඇති බවට සංඥාවක් පෙන්නුම් කර විට වත්කමින් උපයාගත හැකි අගය තක්සේරුගත කරනු ලැබේ.

වත්කමක ඉදිරියට ගෙන ශේෂය, අයකර ගත හැකි අගයට වඩා අඩු වූ විටක හානිකරණ අලාභය හඳුනා ගැනේ. තවද එම හානි කරණ අලාභය අදාල මුදල් ජනන ඒකකයට පළමුව අනුයුක්ත කළයුතු අතර එහි කීර්ති නාමය හා වෙනත් වත්කම් වල ශේෂ වලට සමානුපාතිකව ගැලපිය යුතුය.

2.2.10 වගකීම් හා වෙන් කිරීම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වගකීම් වර්ගීකරණයේ ජංගම වගකීම් වන්නේ ඉල්ලුම මත ගෙවිය යුතු ද සහ/හෝ වාර්තා කරන දිනයේ සිට අවුරුද්දක් ඇතුළත වන අතර හෝ වාර්තා කරන ලද දිනයට පසු අවුරුද්දකට වඩා තිබෙන ජංගම නොවන වගකීම්ය.

මූල්‍ය ප්‍රකාශණ පිළියෙලි කිරීමේදී සියලුම දන්නා වගකීම් ගණනය කර ඇත.

2.2.10.1 සේවක ප්‍රතිලාභ

ස්ථීර දායකත්ව සැලසුම

ස්ථීර දායකත්ව සැලසුම යනු පසු රැකියා ප්‍රතිලාභ සැළසුමක් වන අතර අස්ථිතත්වයක් විසින් වෙනත් අස්ථිතත්වයකට ස්ථීර දායක මුදලක් තැන්පත් කරන අතර, තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ අනුමැතියකින් බැඳි නැත. අර්ථ සාධක අරමුදලට හෝ සේවක භාරකාර අරමුදලට සියලුම සේවකයින් ආවරණය වන පරිදි සිදුකරන ලාභ, අලාභ ගිණුමේ වියදම් ටීමක් ලෙස හඳුනාගනු ලැබේ.

සමාගම විසින් සේවක අර්ථ සාධක අරමුදලට සහ භාරකාර අරමුදලට දළ ඉපයීම් වලින් වෙනුවෙන් 12% සහ 03% ක පිළිවෙලින් දායකවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

ප්‍රතිලාභ සැළසුම යනු පසු රැකියා ප්‍රතිලාභ සැළසුමක් වන අතර එය දායක සැළැසුමකට වඩා එකකි. ප්‍රතිලාභ විග්‍රාහය ගණනය කරන්නේ නිදහස් ආයුගණනයෙනි. (ACTUARIES) දැනට පවතින ප්‍රතිලාභ වටිනාකම තීරණය කරනු ලබන්නේ ඇස්තමේන්තු ගත කරන ලද අනාගත මුදල් ප්‍රවාහය අඩුකරන සහ මුදලේ පවතින පොලි භාවිතා කරමින් සහ එහි ප්‍රතිලාභ ගෙවීමෙන් සහ කල්පිරීමට තිබෙන වගකීමේ කොන්දේසි මතය.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

විශ්‍රාම ප්‍රතිලාභ වෙන්කිරීමේ වල දැනට තිබෙන වටිනාකම් කරුණු කිහිපයක් මත රඳා පවතින අතර ඒවා තීරණය කරනු ලබන්නේ බොහෝ කරුනු මතය. බෙදන ලද විශ්‍රාමික ප්‍රතිලාභ තීරණය කිරීමෙදි වන ප්‍රධාන උපකල්පන සටහන් අංක 19.1 සඳහන් කර ඇත. මෙම උපකල්පන වල මොනයම් හෝ වෙනසක් සිදුවුව හොත් නිශ්චිත ප්‍රතිලාභ වල ගෙන යන ගණනට බලපෑමක් ඇත.

ආයුගණක (ACTUARIAL) ලාභ සහ අලාභ බෙදන ලද ප්‍රතිලාභ සහ බැඳීම් අනිකුත් සම්පූර්ණ අදායම්වල හටගන්නා කාලයේදී බවට හඳුනාගැනේ. එවැනි ආයුගණක ලාභ සහ අලාභ ඉතිරිකරගත් ඉපයීම් සඳහාය. වහාම සහා සම්පූර්ණයෙන් හඳුනාගන්නා ලද අතර පසුකාලීනව ලාබ හෝ අලාභ සඳහා නැවත වර්ගීයකරණු නොලැබේ.

සෑම සේවකයෙකුගේ පළමු වසරේ පටන් විශ්‍රාමික පාරිතෝෂිකයක් ගෙවීමට ප්‍රතිපාදන යොදා ඇති අතර එය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතියට අනුකූලවේ. කෙසේ වෙතත් පාරිතෝෂික ගෙවීම් පණත් අංක 12 හේ 1983 යටතේ වගකීම පැන නගින්නේ නොකඩවා 5 අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණි.

වගකීම සඳහා පිටතින් මුදල් යොදවනු නොලැබේ.

කෙටිකාලීන ප්‍රතිලාභ

සේවකයෙකුගේ කෙටි කාලීන ප්‍රතිලාභ වෙන්කිරීම් මතිනු ලබන්නේ වට්ටම් නොවන පදනම යටතේ වන අතර ඒවා සේවා සැපයීමේ වියදම් ලෙස සළකනු ලැබේ.

2.2.10.2 රජයේ ප්‍රදානය

ශේෂ පත්‍රයේ පෙන්නුම් කරන ලද රජයේ ප්‍රදානයන් අඩංගු වන්නේ ලබාගත් 2011 අංක 43 දරණ ඍන ක්‍රියාකාරී ව්‍යවසායන් හා උපයෝගී වත්කම් පුනුරුදය කිරීමේ පනත යටතේ ලබාගත් ශුද්ධ වත්කම් සහ පසුව දායක වූ කාරක ප්‍රාග්ධනය වේ.

2.2.10.3 වෙන්කිරීම්

වෙන් කිරීම් හඳුන්වනු ලබන්නේ පසුවූ සිද්ධියක සමාගමේ දැනට නෛතික හෝ වැඩදායක බැඳීමක් තිබේනම් සහ එය විශ්වාසව ඇස්තමේන්තු කළ හැකිනම් සහ සම්පත් පිටතට සංචරණය කරමින් සහ ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් කර එහි බැඳීම් නිරාකරණය කිරීම අත්‍යාවශ්‍යය.

2.2.11 ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කිරීම

සමාගම විසින් පළමු වරට සමහර ප්‍රමිතීන් සහ සංශෝධන උපයෝගකර ගත් අතර, ඒවා පෙර පැවති මූල්‍ය ප්‍රකාශණ නැවත ප්‍රකාශ කිරීමට අවශ්‍යය.

නව ප්‍රමිතීන් සහ සංශෝධනයකම ස්වාභාවය සහ එහි බලපෑම් පහත විස්තර කෙරේ.

SLFRS 13 - සාධාරණ අගයට තක්සේරු කිරීම

SLFRS 13 යටතේ වන සියලුම මිනුම්වල සධාරණ අගය SLFRS 13 තනි මග පෙන්වීමක් පිහිටුවයි. අස්ථිත්තයකට සධාරණ අගය භාවිතා කිරීමට අවශ්‍ය වූ විට SLFRS 13 වෙනස් නොකෙරේ. නමුත් SLFRS යටතේ සධාරණ අගය තකසේරු කරනු ලැබේ. SLFRS 13 සධාරණ අගය විග්‍රාහ කරන්නේ පවතින මිල වශයෙනි. SLFRS 13 මගපෙන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, බෙදීම එහි සධාරණ අගය මැනීම් සඳහා එහි ප්‍රතිපත්තියක් නැවත තක්සේරු කරනු කරනු ලැබේ. එසේම SLFRS වලට අතිරේක හෙලිදරව්වක් අවශ්‍යවේ. SLFRS 13 සමාගමේ සාධාරණ අගය භෞතික උත්පාදන ගැටීමක් ඇතිනොවේ.

LKAS -1 අනිකුත් ආදායම් විස්තීරණවල විෂයාංක ඉදිරිපත් කිරීම LKAS -1 ට සංශෝධන

LKAS1ට වන සංශෝධන OCI හි ඉදිරිපත් කර ඇති විෂයාංක කාණ්ඩයක් ඉදිරිපත් කරයි. ලාභ, අලාභවලට ඉදිරිකාලයේදී නියමිත වේලාවට නැවත විග්‍රාහ කළ යුතු ('ප්‍රතිවර්ගීකරණය') (උදාහරණ : AFS හි මූල්‍ය වත්කම් වල ශුද්ධ අලාභය හෝ ලාභය) වෙන් වශයෙන් නැවත විග්‍රහ නොකරන විෂයාංක වෙන්ව ඉදිරිපත් කළ යුතුය. (උදාහරණ : ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම) සංශෝධන ඉදිරිපත් කිරීමට පමණක් බලපාන අතර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හෝ ප්‍රතිඵල මත බලපෑමක් නොමැත.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.3 ඇස්තමේන්තුවල සහ විනිශ්චයේ භාවිතය

සමාගමේ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී පාලනාධිකාරියට අවශ්‍ය වන්නේ විනිශ්චය කිරීම්, ඇස්තමේන්තු සහ වාර්තා කරන ලද ආදායම් ගණනයට බලපාන ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වාර්තා කරන කාලය අවසානයේදී හෙලිදරව් වන හදිසි වගකීමය. කෙසේ නමුත් උපකල්පන සහ ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාවයන්ගේ ප්‍රතිඵලය වන්නේ වත්කම් සහ වගකීම් වල ගෙනයන ප්‍රමාණාත්මක වෙනස් කිරීම් අනාගත කාලයේ අවශ්‍යවීමය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික පළපුරුද්ද සහ අනිකුත් කරුණු මත පවතනි අතර (කරුණු යටතේ විශ්වාස කළ හැකි සාධාරණ බලාපොරොත්තු ද ඇතුළුව) එබැවින් නියම බලාපොරොත්තු සහ ප්‍රතිඵල මෙවැනි විනිශ්චයන්ගේ සහ ඇස්තමේන්තු වල වෙනස් විය හැක. ඇස්තමේන්තුව සහ උපකල්පන නැවත සළකා බලන්නේ අඛන්ඩව ක්‍රියාත්මක වන පදනම මතය. ගිණුම් සංශෝධන ඇස්තමේන්තු හඳුනාගනු ලබන්නේ ඇස්තමේන්තු සංශෝධන කරන කාලය තුළදී වන අතර සංශෝධන එම කාලයට පමණක් බලපවතී නම් හෝ ඉදිරිකාලයට ද ඇතුළත්ය. සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති උපයෝගි කර ගැනීමේ ක්‍රියාවලියේදී අනාගතය පිළිබඳව වන ප්‍රධාන උපකල්පන වාර්තා කරන දිනයේදී වන ඇස්තමේන්තුවේ ප්‍රභවයන් සමඟ සහ අදාළ විනිශ්චයන්ගේ අර්ථවත් අවධානමක් සහ ප්‍රමාණාත්මක ගැලපුමක් වත්කම් සහ වගකීම් ගෙනයෑමේදී වන සඳහන් ලබන ගිණුම් වර්ෂයේ පිළිබඳව පහත සාකච්ඡා කෙරේ.

මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

හානිකරණය පවතින්නේ වත්කමක රැගෙන යෑමේ වටිනාකම් හෝ මුදල් උත්පාදනය කිරීමේ ඒකකය එහි අයකර ගත හැකි අගයට වැඩි වූ විටදී සහ එහි සාධාරණ අගය වැඩි වූ වටිනාකමේ හා විකිණීමට දැරු පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමය. සාධාරණ අගයෙන් විකිණීමට දැරු පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන අගය හෝ භාවිතාවේ අගයෙන් අවම අගයයි. එසේම අතේ දුරින් වන එක හා සමාන වත්කම් ගනුදෙණුවේදී හෝ නිරීක්ෂණ කරන ලද වෙළඳ මිලට වර්ධනය වන පිරිවැයට අඩුවෙනි. ගණනය කරන වටිනාකම ගණනය කරන්නේ අඩුකරන ලද මුදල් සංවරණ මොඩලයක් මගිනි. අය කළ හැකි ගණන අඩු කරන ලද ගණනට බොහෝ සියුම් වන අතර එය අඩු කරන ලද මුදල් මොඩල සංසරණයට සහ බිහිතැන් සෙවීම් (Extra polation) සඳහා භාවිත කරන වර්ධන අනුපාතය සඳහාය.

දේපල කර්මාන්ත ශාලා සහ උපකරණ ක්ෂය වීම්

භාවිතා කිරීමට බලාපොරොත්තු වන කළමණාකරණ පැවරීම් සහ කර්මාන්ත ශාලා සහ උපකරණ වල ඉතිරි වී ඇති වටිනාකම් මත සහ මෙම වත්කම් වල ආර්ථික වටිනාකමය. පසුව සිදුවන වෙනස්කම් යටතේ කාර්මික දියුණුවීම හෝ වත්කම් භාවිතය වැනි දෑ නියම ප්‍රයෝජනවත් ජීවිත කාලයක ප්‍රතිඵලයක් විය හැකි අතර හෝ ප්‍රථම ඇස්තමේන්තු වල ඉතිරි වටිනාකම් වල වෙනස්වීමය. කළමණාකරනය විසින් වාර්ෂික ඉතිරි වටිනාකම් සහ දේපළ වල ප්‍රධාන කොටස් වල කර්මාන්තශාලා සහ උපකරණ නැවත විමර්ෂණය සිදුකෙරේ.

ලැබිය යුතු දෑ වල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තා කරන දිනයකදීම සියළුම ලැබියයුතු දෑ තක්සේරු කිරීම සඳහා දීමනාවන් ලාභ/අලාභයන්ගේ සටහන් කළ යුතු දීමනා නැවත විමසා බලයි. සමාගම විසින් එවැනි දීමනාවන් ඇස්තමේන්තුගත කිරීමේදී විනිශ්චය භාවිතා කරන අතර ණය කාලයේ කාලයද තීරණය කරමින් සහ පාලනාධිකාරිය විසින් දන්නා අනිකුත් කරුණු එහි නැවත අයකර ගැනීම පිළිබඳ තිබෙන සැකය පෙන්වයි.

2.4 නිකුත් කළ නමුත් තවමත් බලපෑ නැති ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ සංගමය විසින් පහත සඳහන් ප්‍රමිති (SLFRS) නිකුත් කර ඇති අතර, ඒවා අනාගත දිනයකදී බලපෑ අතර සහ ඒවා මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී භාවිතා නොකරන ලදි. එකි ප්‍රමිති (SLFRS), සමාගම විසින් දැනට යොදාගෙන ඇති ගිණුම් ප්‍රතිපත්තීන් මත බලපෑමක් ඇති අතර සමහරවිට අනාගත මූල්‍ය ප්‍රකාශන මත බලපෑම් කරයි.

(i) SLFRS - 9 මූල්‍ය මෙවලම් - වර්ගීකරණය සහ තක්සේරුව

2014 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංක වරලත් ගණකාධිවරුන්ගේ සංගමය විසින් SLFRS 39 අවසාන මූල්‍ය මෙවලමේ අවසන් අනුවාදය නිකුත් කර ඇති අතර එහි සියලුම මූල්‍ය මෙවලම් ව්‍යාපෘතීන් පෙන්වා දී ඇති අතර LKRS 39 මූල්‍ය මෙවලම් හඳුනාගැනීම් සහ ගණනය කිරීම ද එයින් හෙලිදරව් කර ඇත. එහි ප්‍රමිතිය මගින් වර්ගීයකරණය, තක්සේරු කිරීම, හානිකරනය සහ HEDGE ගිණුම් කටයුතු වෙනුවෙන් නව අවශ්‍යතා හඳුන්වා දෙන ලදී.

SLFRS 9 වසරකට බලපවත්වන්නේ 2013 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වන අතර ඊටපෙරද එය භාවිතාකළ හැක අතීතානුයෝගී ලෙස භාවිතා කල යුතු නමුත් සංසේන්දනාත්මක තොරතුරු අත්‍යවශ්‍ය නොවේ. SLFRS - 9 භාවිතා කිරීම තුලින් සමාගමේ මූල්‍ය වත්මකම් වර්ගීකරණයට සහ ගණනය කිරීමට බලපෑමක් ඇති වන අතර මූල්‍ය වගකීම් වර්ගීකරණයට සහ ගණනයට කිසිදු බලපෑමක් ඇති නොකරයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

(ii) SLFRS - 15 **ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම් තුලින් ලැබෙන ආදයම්**

SLFRS 15 මඟින් කොපමණ අදයමක් කුමන දිනකදී හඳුනාගත්තේද යන්න තීරණය කිරීම පිණිස පුළුල් රාමුවක් ස්ථාපිත කර ඇත. එය LKAS 18 - ආදයම්, LKAS 11 - ඉදිකිරීම් ගිවිසුම් සහ IFRIC 13 - ගණුදෙනුකරුවන් සම්බන්ධ ලැදිකම සම්බන්ධ වැඩසටහන් වැනි දැනට පවත්නා ආදයම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරනු ලබයි. මෙම ප්‍රමිතිය 2017 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික කාලසීමාවන් සඳහා බල පැවැත්වේ.

ඉහත සඳහන් කල දැට අමතරව SLFRS 14 - Regulatory Deferral Accounts ප්‍රමිතියද 2016 ජනවාරි මස 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන්ට බලපැවැත්වෙයි.

සමාගම විසින් මෙම ප්‍රමිතීන් බලාත්මක වන දිනෙන් පසු භාවිතා කිරීමට කටයුතු යොද ඇත. සවිස්තර සමාලෝචනයක් සිදුකරන තෙක් මූල්‍ය බලපෑම සාධාරනව තක්සේරු කල නොහැක.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

4. ආදායම

	2014 රුපියල්	2013 රුපියල්
4.1 සංක්ෂිප්තය		
භාණ්ඩ විකිණීම	5,539,305,323	5,747,048,373
	5,539,305,323	5,747,048,373
4.2 පහත සඳහන් අයුරින් ආදායම උපැයේ:		
සීනි	3,167,907,618	2,811,827,420
මොලැසස්	334,100	19,171,770
ENA	2,371,063,605	2,916,049,183
	5,539,305,323	5,747,048,373

4.3 ඛණ්ඩ තොරතුරු

	ප්‍රධාන කාර්යාලය රුපියල්	පැල්වත්ත කොට්ඨාශය රුපියල්	හෙවනගල කොට්ඨාශය රුපියල්	බැහැර කිරීම් රුපියල්	එකතුව රුපියල්
ඛණ්ඩ ආදායම්	-	3,390,606,266	2,148,699,057	-	5,539,305,323
ඛණ්ඩ ප්‍රතිඵල					
දළ ලාභ/අලාභ	-	45,663,251	586,115,544	3,470,550	635,249,345
වෙනත්					
ප්‍රාග්ධන වියදම්	869,145	178,829,391	57,328,672	-	236,953,185
ක්ෂය වීම	4,206,142	197,851,435	76,483,168	-	278,540,745
ඛණ්ඩ වත්කම්					
ජංගම නොවන වත්කම්	13,292,363	2,176,080,357	615,300,620	-	2,804,673,340
ජංගම වත්කම්	36,147,360	3,030,119,128	1,775,375,658	(73,346,641)	4,768,295,505
ඛණ්ඩ වගකීම්					
ජංගම නොවන බැරකම්	7,116,000	437,389,131	111,296,657	-	555,801,788
ජංගම බැරකම්	50,132,640	1,299,292,278	842,767,435	(73,346,641)	2,118,845,711

5. අනෙකුත් ආදායම් සහ ලාභ

	2014 රුපියල්	2013 රුපියල්
අනෙකුත් සේවා ආදායම්	54,994,146	42,795,184
අමතර ආදායම්	824,094	7,393,906
පූර්ව කළමනාකරණය වෙත ENA මාරු කිරීමෙන් ලද ලාභය	-	3,089,670
	55,818,240	53,278,760

6. මූල්‍ය වියදම් සහ ආදායම්

	2014 රුපියල්	2013 රුපියල්
6.1 මූල්‍ය වියදම්		
බැංකු ණය සඳහා පොලි වියදම්	3,069,424	3,837,782
බැංකු අයිරාවන් සඳහා පොලි වියදම්	32,530,456	28,289,975
කල් බදු මත මූල්‍ය ගාස්තු	14,447,367	185,559
	50,047,247	32,313,316
6.2 මූල්‍ය ආදායම්		
ගොවීන්ගෙන් අයවිය යුතු ණය සඳහා පොලි	26,163,780	25,241,963
තැන්පතු වලින් පොලී ආදායම්	134,330,828	110,791,383
අනෙකුත් පොලී ආදායම්	14,068	9,786
	160,508,676	136,043,131

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

7. බදු ගෙවීමට පෙර ලාභය

අයකලාට පසුව ප්‍රකාශිත	2014 රුපියල්	2013 රුපියල්
විකුණුම් පිරිවැය ඇතුලත් වූ		
නිර්වචනය කරන ලද දයක සැලසුම් වෙනුවෙන්		
- වියදම් EPF, ETF ඇතුලත් සේවක ප්‍රතිලාභ	184,237,286	191,702,397
ක්ෂයවීම්	252,586,859	189,605,767
පරිපාලන වියදම්වලට ඇතුලත් වූ		
- නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වෙනුවෙන්		
වියදම් - පාරිතෝෂකය	121,717,782	28,416,132
- නිර්වචනය කරන ලද දයක සැලසුම් වෙනුවෙන් වියදම් EPF, ETF ඇතුලත් සේවක ප්‍රතිලාභ	37,673,352	27,804,508
ක්ෂයවීම්	25,953,886	9,997,137
විගණන ගාස්තු	2,242,970	2,216,600
බොල් ගොවිණය	40,557,693	23,925,477

8. ආදායම් බදු වියදම/(ප්‍රත්‍යාවර්තනය)

	2014 රුපියල්	2013 රුපියල්
වර්තමාන ආදායම් බදු	24,448,211	530,331,109
විලම්බිත බදු ගාස්තු/(ප්‍රත්‍යාවර්තනය)(8.2 සටහන)	(84,624,186)	(1,442,469)
	(60,175,975)	528,888,640

8.1 වර්තමාන ආදායම් බදු වියදම/(ආදායම) සහ ගිණුම් ගත ලාභය/අලාභය සමඟ සංසන්දනය

ආදායම් බදු ගෙවීමට පෙර ගිණුම් ගත ලාභය/අලාභය	(211,012,935)	1,341,898,939
පෙර වසරේ ලාභ සඳහා ගැලපුම්	-	733,478,503
ගැලපුම් කරන ලද ආදායම් බදු ගෙවීමට පෙර ගිණුම් ගත අලාභය	(211,012,935)	2,075,377,442
ඉඩදිය නොහැකි අයිතම එකතුව	451,784,967	368,313,455
ඉඩදිය හැකි අයිතම එකතුව	(485,102,035)	(203,860,596)
භාවිතා කරන ලද ආදායම් බදු අලාභය / ආදායම් බදු සඳහා ව්‍යාපාරික ලාභ	(244,330,002)	2,239,830,301
අනිකුත් ආදායම් මාර්ග බදු අයකිරීමට සුදුසු		
පොලී ආදායම්	134,330,828	131,686,487
තක්සේරු කල හැකි මුළු ආදායම	134,330,828	2,371,516,788
වසර තුළදී භාවිතා කළ බදු අලාභය	(47,015,790)	(477,477,114)
බදු අය කළ හැකි ආදායම	87,315,038	1,894,039,674
28% අනුපාතය අනුව ව්‍යාපාරික ලාභය සඳහා ආදායම් බදු	24,448,211	530,331,109
බදු අලාභය ඉදිරියට ගෙන ඒම	-	477,477,114
බදු අලාභ වර්ෂය තුළදී	244,330,002	-
බදු අලාභ භාවිතය වර්ෂය තුළදි	(47,015,790)	(477,477,114)
බදු අලාභ ඉදිරියට ගෙන ආවා	197,314,212	-

8.2 විලම්භීත බදු වත්කම්

	ලාභ/අලාභ ප්‍රකාශනය		මූල්‍ය තත්ව ප්‍රකාශනය	
	2014	2013	2014	2013
විලම්භීත බදු වගකීම්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
දේපල, කර්මාන්ත ශාලා සහ උපකරණ මත	(29,488,549)	-	(29,488,549)	-
	(29,488,549)	-	(29,488,549)	-
විලම්භීත බදු වත්කම්				
දේපල, කර්මාන්ත ශාලා සහ උපකරණ මත	-	1,442,469	(1,442,469)	1,442,469
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් මත	115,555,204	-	115,555,204	-
	115,555,204	1,442,469	114,112,735	1,442,469
			84,624,186	1,442,469
විලම්භීත බදු ආපසු හැරවීම්				
	86,066,655	1,442,469		
ශුද්ධ විලම්භීත බදු වත්කම්				

9. කොටසක ඉපයුම්

9.1 කොටසකට අයත් මූලික ඉපැයීම් ගණනය කරනුයේ අදල කාල සීමාව තුල සාමාන්‍ය කොටස්කරුවන්ට ආරෝපණය වන ශුද්ධ ලාභය/(අලාභය), සාමාන්‍ය කොටස්වල බර තැබූ මධ්‍යන්‍ය ප්‍රමාණයෙන් බෙදීයෙමින්ය.

9.2 සාරාංශයක් සැටියට සාවිතා කරන ලද ප්‍රමාණයන්:

	2014 රුපියල්	2013 රුපියල්
කොටසකට අයත් මූලික ඉපැයීම් ගණනය කිරීම් සඳහා සාමාන්‍ය කොටස්කරුවන්ට ආරෝපණය වන ශුද්ධ ලාභ/(අලාභ)	(150,836,960)	816,828,301

	2014 රුපියල්	2013 රුපියල්
හාගයක් සැටියට භාවිතා කරන ලද සාමාන්‍ය කොටස් ප්‍රමාණය		
කොටසකට අයත් මූලික ඉපැයීමට අදල නිකතුවට අයත් බර තැබූ මධ්‍යන්‍ය සාමාන්‍ය කොටස් ප්‍රමාණය වේ.	100	100

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

දේපල, පිරියත හා උපකරණ

10.1 **දළ ධාරණ අගයන්**

	2014.01.01දී ශේෂය රුපියල්	එකතුකිරීම රුපියල්	බැහැරකිරීම් රුපියල්	2014.12.31දී ශේෂය රුපියල්
ඉඩම්	44,149,728	-	-	44,149,728
ඉඩම් සංවර්ධනය	126,303,161	-	-	126,303,161
කර්මාන්තශාලා ගොඩනැගිලි	234,179,323	7,214,136	-	241,393,459
අනෙකුත් ගොඩනැගිලි	205,802,676	23,356,925	-	229,159,601
ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ	380,273,637	19,200,507	(1,632,551)	397,841,593
වාරිමාර්ග සහ අමතර උපකරණ	176,850,825	-	-	176,850,825
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	2,004,812,928	608,857,859	(3,771,000)	2,609,899,787
අනෙකුත් පිරියත හා උපකරණ	136,604,268		-	136,604,268
ගබඩා කිරීමට ටැංකි	63,398,475	-	-	63,398,475
මාවත් සහ පාලම්	111,179,516	-	-	111,179,516
රසායනාගාර උපකරණ	49,291,526	-	-	49,291,526
රථ වාහන	143,857,227	16,903,000	(294,870)	160,465,357
ගෘහ භාණ්ඩ, මෙවලම් සහ උපකරණ	126,729,060	19,422,832	-	146,151,892
ජනාවාස ගොවි යටිතල පහසුකම්	69,525,819	3,667,920	-	73,193,739
	3,885,738,168	698,623,178	(5,698,421)	4,565,882,925
රථ වාහන	7,300,000	4,368,750	-	11,668,750
ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ	12,780,000	55,948,920	-	68,728,920
	20,080,000	60,317,670	-	80,397,670
ඉදිකෙරෙමින් පවතින				
ඉඩම් සංවර්ධනය	15,750,933	35,444,350	(7,468,101)	43,727,182
කර්මාන්ත පිරියත හා උපකරණ	43,141,545	2,717,830	(42,958,446)	2,900,929
හෝටල් ව්‍යාපෘතිය	37,410,797	-	-	37,410,797
කොම්පෝස්ට් නිෂ්පාදනාගාරය	571,362	-	-	571,362
වාරිමාර්ග ව්‍යාපෘතිය	2,347,750	-	(2,347,750)	-
විදුලිබල ජනන ව්‍යාපෘතිය	1,577,094	202,325	-	1,779,419
ජලය පවිත්‍රාගාර	-	25,856,579	-	25,856,579
	100,799,481	64,221,083	(52,774,297)	112,246,268
මූල්‍ය කල්බදු මත වත ඉදිකිරීම්				
කර්මාන්ත ශාලා පිරියත සහ උපකරණ	-	120,750,000	-	120,750,000
	-	120,750,000	-	120,750,000
ඉදිරියට ගෙන යන මුළු දළ ගණන	4,006,617,649	943,911,932	(58,472,718)	4,879,276,862

10.2 **ක්ෂයවීම**

	2014.01.01දී ශේෂය රුපියල්	අදාළ කාල සීමාවට ගාස්තුව රුපියල්	බැහැරකිරීම් රුපියල්	2014.12.31දී ශේෂය රුපියල්
ඉඩම් සංවර්ධනය	56,105,172	2,528,459	-	58,633,631
කර්මාන්තශාලා ගොඩනැගිලි	126,140,932	5,014,234	-	131,155,166
අනෙකුත් ගොඩනැගිලි	103,629,941	4,094,650	-	107,724,591
ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ	361,530,567	12,009,754	(1,632,553)	371,907,768
වාරිමාර්ග සහ වෙනත් උපකරණ	128,326,844	6,584,704	-	134,911,548
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	625,973,570	192,062,386		818,035,956
අනෙකුත් පිරියත හා උපකරණ	32,413,589	10,089,144	-	42,502,733
ගබඩා කිරීමට ටැංකි	13,872,075	2,967,660	-	16,839,735
මාවත් සහ පාලම්	95,815,458	1,783,672	-	97,599,130
රසායනාගාර උපකරණ	21,469,208	4,455,558	-	25,924,766
රථ වාහන	73,499,949	18,684,705	(294,870)	91,889,783
ගෘහ භාණ්ඩ, මෙවලම් සහ උපකරණ	105,098,870	8,067,336	-	113,166,206
ජනාවාස ගොවි යටිතල පහසුකම්	66,166,127	385,395	-	66,551,522
	1,810,042,302	268,727,657	(1,927,423)	2,076,842,536
මූල්‍ය කල්බදු මත වත්කම්				
රථ වාහන	243,333	1,460,000	-	1,703,333
ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ	-	8,353,088	-	8,353,088
	243,333	9,813,088	-	10,056,421
ක්ෂයවීම් එකතුව	1,810,285,636	278,540,745	(1,927,423)	2,086,898,957

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

2014 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

10. දේපල, පිරියත හා උපකරණ (හිඟ කොටස)

10.3 පොත්වල ශුද්ධ අගය

	2014 රුපියල්	2013 රුපියල්
ඉඩම්	44,149,728	44,149,728
ඉඩම් සංවර්ධනය	67,669,529	70,197,988
කර්මාන්තශාලා ගොඩනැගිලි	110,238,292	108,038,391
අනෙකුත් ගොඩනැගිලි	121,435,009	102,172,734
ක්ෂේත්‍ර යන්ත්‍ර සහ උපකරණ	25,933,826	31,523,069
වාරිමාර්ග සහ වෙනත් උපකරණ	41,939,277	48,523,981
